# 3
## ශ්‍රේණිය

## මූලික පිරිවෙන්
# ත්‍රිපිටක ධර්මය

# මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර
## Mid Term and Year End Papers

**මූලික පිරිවෙන් මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර i-ii**



මූලික පිරිවෙන් ත්‍රිපිටක ධර්මය මධ්‍ය හා අවසන් වාර ප්‍රශ්න පත්‍ර

# ත්‍රිපිටක ධර්මය

## මධ්‍ය වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2018

# Primary Piriven Mid Year Tearm Test - 2018

## ශ්‍රේණිය 03 /Grade 03

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ත්‍රිපිටක ධර්මය — කාලය : පැය තුනයි
Thripitaka Dharmaya — Time : Three Hours

ත්‍රිපිටක ධර්මය

සැලකිය යුතුයි :

පළමුවන කොටසේ ප්‍රශ්න සියල්ලටම ද II, III කොටස්වලින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ තවත් ප්‍රශ්න පහකට ද පිළිතුරු සපයන්න.

### I කොටස

i. 'මම බුදුන් මරා බුදු වන්නෙමි, ඔබ ද පියා මරා රජ වන්නැයි' ද කියා බිම්බිසාර රජු මරා දැමීමට උපදෙස් ලබා දුන්නේ

1. අංගුලිමාල තෙරුන් ය    2. කිම්බිල තෙරුන් ය
3. කෝකාලික තෙරුන් ය    4. දෙව්දත් තෙරුන් ය

ii. ප්‍රථම විනය ශික්ෂා පදය පනවන ලද්දේ

1. උපාලි භික්ෂුවට ය    2. සුදින්න භික්ෂුවට ය
3. උදායි භික්ෂුවට ය    4. සුභද්‍ර භික්ෂුවට ය

iii. 'යො වදතං පවරො මනුජෙසු' යන ආදි ගාථා පෙළ දේශනා කළේ

1. මහානාම ශාක්‍යයාට ය    2. නන්ද මානවකයාට ය
3. ඡත්ත මානවකයාට ය    4. පිප්පලී මානවකයාට ය

iv. පොළොන්නරු යුගයේ භික්ෂූන් වහන්සේ වෙනුවෙන් පොළොන්නරු කතිකාවත නමින් නව ව්‍යවස්ථාවක් නිර්මාණය කළේ

1. මහා විජයබාහු රජතුමා ය    2. නිශ්ශංකමල්ල රජතුමා ය
3. මහා පරාක්‍රමබාහු රජතුමා ය    4. මානාභරණ රජතුමා ය

v. තොටගමුවේ ශ්‍රී රාහුල හිමිපාණන්ගේ ආචාර්යවරයා වූයේ

1. වීදාගම මෛත්‍රී හිමියන් ය    2. කැරගල වනරතන හිමියන් ය
3. රත්මලානේ ධර්මාලෝක හිමියන් ය    4. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් ය

vi. යමෙකුගෙන් යමක් ඉල්ලීම එක් හැඬීමකි. දෙන තැනැත්තා එම ඉල්ලීමට නැතැයි කීවේ නම් එය දෙවන හැඬීමය. යන ප්‍රකාශය කළේ කවුරුන් ද?

1. සුමේධ තාපසතුමා ය    2. අසිත තාපසතුමා ය
3. කොණ්ඩඤ්ඤ තාපසතුමා ය    4. බෝසත් තාපසතුමා ය

vii. බම්භකත වග්ගයට අයත් සේඛියා ගණන කොපමණද?

1. 10 කි    2. 8 කි    3. 15 කි    4. 12 කි

viii. 'න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා' පෙළ සඳහන්ව ඇත්තේ

1. ඛම්භකත වග්ගයේ ය
2. උජ්ජග්ඝික වග්ගයේ ය
3. පාදුකා වග්ගයේ ය
4. කබල වග්ගයේ ය

ix. සො ඤාති ධම්මො ච අයං නිදස්සිතො යන ගාථා පාඨය ඇතුළත් සූත්‍රය වන්නේ

1. සප්පුරිසදාන සූත්‍රය
2. සුභාෂිත සූත්‍රය
3. තිරෝකුඩ්ඩ සූත්‍රය
4. නිධිකණ්ඩ සූත්‍රය

x. බුදුරජාණන් වහන්සේ අභිධර්මය දේශනා කරන ලද්දේ

1. තුසිත දෙව්ලොව දී ය
2. නිම්මාන රති දෙව්ලොව දී ය
3. පරනිම්මිත දෙව්ලොව දී ය
4. තව්තිසා දෙව්ලොව දී ය

xi. අභිධර්මයේ පරමාර්ථ ධර්ම පිළිවෙළින් ඇතුළත් වන වර්ණය වන්නේ.

1. චිත්ත, රූප, චෛතසික, නිබ්බාණ
2. චිත්ත, චෛතසික, නිබ්බාණ, රූප
3. චිත්ත, චෛතසික, රූප, නිබ්බාණ
4. චිත්ත, නිබ්බාණ, චෛතසික, රූප

xii. ධම්මපදය අයත් වන නිකාය ග්‍රන්ථය වන්නේ

1. අංගුත්තර නිකාය
2. ඛුද්දක නිකාය
3. සංයුත්ත නිකාය
4. දීඝ නිකාය

xiii. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ ධර්මාශෝක රජතුමාට බුදුදහම හඳුන්වාදුන් ගාථා පාඨය වන්නේ

1. ''අප්පමාදෙන මඝවා''
2. ''අප්පම්පි චේ සහිතං''
3. ''අප්පමාදො අමතපදං''
4. ''අප්පකා තෙ මනුස්සෙසු''

xiv. සතර ඉද්ධිපාද අයත් වර්ණය වන්නේ

1. සද්ධා, විරිය, සති, සමාධි
2. සද්ධා, විරිය, සති, පඤ්ඤා
3. සති, ධම්ම විචය, විරිය, පිති
4. ඡන්ද, චිත්ත, විරිය, විමංසා

xv. 90 වන පුරුෂ සූක්තයේ දැක්වෙන පරිදි බ්‍රාහ්මණ වර්ණ ධර්ම පිළිවෙළින් ඇතුළත් වර්ණය වන්නේ

1. බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර
2. බ්‍රහ්මණ, ක්‍ෂත්‍රිය, ශුද්‍ර, වෛශ්‍ය
3. බ්‍රහ්මණ, වෛශ්‍ය, ක්‍ෂත්‍රිය, ශුද්‍ර
4. බ්‍රහ්මණ, ශුද්‍ර, වෛශ්‍ය, ක්‍ෂත්‍රිය

xvi. බ්‍රාහ්මණ ස්වධර්ම අනුව වෛශ්‍යයන්ට පැවරී ඇති වගකීම් අතුරින් වගකීමක් නොවන්නේ

1. කෘෂිකර්ම ය
2. වෙළඳාම ය
3. දන් පිළිගැනීම ය
4. යාග කරවීම ය

xvii. දම්සක් පැවතුම් සූත්‍රය අසා පළමුව ධර්මය අවබෝධ කර ගත්තේ

1. වප්ප තෙරුන් ය
2. කොණ්ඩඤ්ඤ තෙරුන් ය
3. මහානාම තෙරුන් ය
4. භද්දය තෙරුන් ය

xviii. බරණැස් සිටුතුමාට දේශනා කරන ලද ධර්ම අසා රහත් භාවයට පත් වූයේ

1. කාලසිටු පුත් කුමරු ය
2. රාහුල කුමරු ය
3. යස කුමරු ය
4. නන්ද කුමරු ය

xix. මෝහ මූලික සිත් දෙක අයත් වර්ණය වන්නේ

1. පටිඝ සම්පයුත්ත, පටිඝ විප්පයුත්ත
2. විචිකිච්චා සම්පයුත්ත, උද්ධච්ච විප්පයුත්ත
3. දිට්ඨිගත සම්පයුත්ත, දිට්ඨිගත විප්පයුත්ත
4. දිට්ඨිගත සම්පයුත්ත, උද්ධච්ච සම්පයුත්ත

xx. අනේපිඩු සිටුතුමා විසින් සාදවා පූජාකරන ලද ආරාමය වන්නේ

1. පූර්වාරාමය යි
2. වේළුනාරාමය යි
3. වාලුකාරාමය යි
4. ජේතවනාරාමය යි

(ලකුණු. 2 × 20 = 40)

## II කොටස

01.

i. බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලද්දන් සතර දෙනෙකු නම් කරන්න.

ii. ඉන් දෙදෙනෙකු පිළිබඳ කෙටි විවරණයක් සපයන්න.

(ලකුණු. 4+8 = 12)

02.

i. ඵන්දනං චපලං චිත්තං......................

ඵෙණූපමං කායමිමං විදිත්වා............ යන ගාථා දෙක සම්පූර්ණ කරන්න.

ii. ඉන් එක ගාථාවක නිදාන කථාව ලියන්න.

(ලකුණු. 8+4 = 12)

03.

i. සප්පුරිසදාන සූත්‍රයේ සඳහන් වන පරිදි සප්පුරිසදාන පහකි. එය නම් කරන්න.

ii. තිරෝකුඩ්ඩ සූත්‍රයෙන් එක් ගාථාවක් තෝරාගෙන දානමය පිංකමක සිදුකරනු ලබන භුක්තානුමෝදනාවක් පිළියෙල කරන්න.

(ලකුණු. 5+7 = 12)

04.

i. ''බිසොවට පළමු රත්නාවලී නම් සොඳුරු'' යන කවිය සම්පූර්ණ කරන්න.

ii. ''මාගේ මෙම ව්‍යායාමය, රජසැප පිණිස නොව සම්බුදු සසුන බැබළවීම පිණිසයි'' මෙම උදාර සංකල්පය විදහා දක්වූ දුටුගැමුණු මහරජු පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු. 4+8 = 12)

## III කොටස

05.

i. භාරතීය බ්‍රාහ්මණ සමාජයේ තිබූ වර්ණ ධර්ම හතර නම් කර ඉන් එකක් පිළිබඳ කෙටි විවරණයක් කරන්න.

ii. ''අසත්‍ය සමාජය තුළ පතුරවන්නන්ගෙන් වන හානිය උග්‍ර සමාජ ව්‍යසනයක් වී තිබේ'' මේ කියමන සමුද්දවාණිජ ජාතක කථාව ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු. 6+6 = 12)

06.

i. බම්භකත වග්ගයට අයත් ගමෙහි හැසිරීමෙහි ශික්ෂා පද හතරක් ලියා දක්වන්න.

ii. භික්ෂු සංස්ථාවෙහි පැවැත්ම සඳහා සේඛියාවන්හි ඇති වැදගත්කම විස්තර කරන්න.

(ලකුණු. 4+8 = 12)

07.

i. පංච නීවරණ ධර්ම පිළිවෙළින් නම් කරන්න.

ii. ආනාපානසති භාවනාව හඳුන්වා, එය වඩන අයුරු විස්තර කරන්න.

(ලකුණු. 5+7 = 12)

08.

i. අට්ඨධා ලෝභ මූලානී යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. ලෝභ මූලික සිත් අට පිළිවෙළින් ලියන්න.

(ලකුණු. 4+8 = 12)

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2019

## Primary Piriven Mid Year Term Test - 2019

3 ශ්‍රේණිය / Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**ත්‍රිපිටක ධර්මය** | කාලය : පැය තුනයි

**Tripitaka Dharmaya** | විභාග අංකය :- ................ | Time : Three hours

❖ පළමුවන කොටසේ ප්‍රශ්න සියල්ලටම ද II කොටසින් ප්‍රශ්න පහකට ද පිළිතුරු සපයන්න.

### I කොටස

01. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් විසිවන වස් කාලය වැඩ විසුවේ,
    i. පූර්වාරාමයේ ය
    ii. වේළුවනාරාමයේ ය
    iii. ජේතවනාරාමයේ ය
    iv. ඝෝෂිතාරාමයේ ය

02. ගිහි කළ බිරිඳගේ ඉල්ලීමෙන් වරදෙහි බැඳීම නිසා බුදුරජාණන් වහන්සේ ප්‍රථම විනය ශික්ෂාපදය පනවා වදාළේ,
    i. උදායි භික්ෂුව උදෙසා ය
    ii. ඡන්න භික්ෂුව උදෙසා ය
    iii. සුදින්න භික්ෂුව උදෙසා ය
    iv. සුභද්ද භික්ෂුව උදෙසා ය

03. බුදුරජාණන් වහන්සේ ''යො වදතං පවරො මනුජේසු'' යනාදී ගාථා පෙළක් දේශනා කළේ,
    i. ඡත්ත මානවකයන්ට ය
    ii. යසකුල පුත්‍රයන්ට ය
    iii. සුභ මානවකයන්ට ය
    iv. පිප්ඵලි මානවකයන්ට ය

04. ''මාගේ මෙම ව්‍යායාමය රජසැප පිණිස නොව සම්බුදු සසුන බැබළවීම පිණිසයි'' යන උදාර සංකල්පය පෙරදැරිව ක්‍රියා කළේ,
    i. කාවන්තිස්ස රජතුමා ය
    ii. දුටුගැමුණු රජතුමා ය
    iii. සද්ධාතිස්ස රජතුමා ය
    iv. මහා පරාක්‍රමබාහු රජතුමා ය

05. අලංකාර චිත්‍රයන් ගෙන් යුත් ''සරස්වතී මණ්ඩපය'' නම් නෘත්‍ය ශාලාවක් ඉදිකර වූ රජතුමා වන්නේ,
    i. මහා පරාක්‍රමබාහු රජතුමා ය
    ii. මහසෙන් රජතුමා ය
    iii. කිත්සිරිමේඝ රජතුමා ය
    iv. සිරිවල්ලභ රජතුමා ය

06. මිහිඳු මාහිමියන් වහන්සේගේ උපාධ්‍යයන් වහන්සේ වූයේ,
    i. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ ය.
    ii. මහා දේව මහ රහතන් වහන්සේ ය
    iii. මහා ධම්මරක්ඛිත මහ රහතන් වහන්සේ ය
    iv. රක්ඛිත මහ රහතන් වහන්සේ ය

07. අනුරාධපුරයෙහි රජකම් කළ මුටසීව රජතුමාගේ පුත්‍ර රත්නයක් වූයේ,

i. පණ්ඩුකාභය කුමරු ය　　ii. දේවානම්පියතිස්ස කුමරු ය

iii. අග්බෝ කුමරු ය　　iv. මහානාග කුමරු ය

08. සතර ඉද්ධිපාද දක්වෙන වර්ණය වන්නේ,

i. සද්ධා, ඡන්ද, චිත්ත, විරිය

ii. ඡන්ද, චිත්ත, වීරිය, විමංසා

iii. සති, ඡන්ද, වීරිය, විමංසා

iv. ඡන්ද, චිත්ත, සද්ධා, වීරිය

09. උජ්ඣග්ගික වග්ගයට අයත් සේඛියා ගණන කොපමණද ?

i. පහළොවකි　　ii. දොළසකි

iii. දහයකි　　iv. අටකි

10. ''න උක්කුටිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීය'' යන සේඛියා පාඨය ඇතුළත් වන්නේ,

i. උජ්ඣග්ගික වග්ගයේ ය　　ii. කබල වග්ගයේ ය

iii. පාදුකා වග්ගයේ ය　　iv. ඛම්භකත වග්ගයේ ය

11. ''දීමට සෝදා ගත් අත් ඇති, ඒ තරමටම දීමට ලැදි කෙනෙකු වීම යන අර්ථය ඇති පදය,

i. මුත්තාචාගො　　ii. වොස්සග්ගරතො

iii. පයතපාණී　　iv. දාන සංවිභාගරතො

13. ''උන්නමෙ උදකං වට්ඨං යථා නින්නං පවත්තතී''යන ගාථා පාඨය ඇතුලත් සූත්‍රය වන්නේ,

i. තිරෝකුඩ්ඩ සූත්‍රය යි　　ii. සුභාසිත සූත්‍රය යි

iii. සප්පුරිසදාන සූත්‍රය යි　　iv. නිධිකණ්ඩ සූත්‍රය යි

14. බුදු, පසේ බුදු මහ රහතන් වහන්සේලාට රාගයෙන් තොරව, සිනහ පහළවන සිත,

i. මනොද්වාරාවජ්ජන සිත නම් වේ

ii. හසිතුප්පාද සිත නම් වේ

iii. පඤ්චද්වාරාවජ්ජන සිත නම් වේ

iv. උපෙක්ඛාසහගත සන්තීරණ සිත නම් වේ

15. 90 වන පුරුෂ සූක්තයේ දක්වෙන පරිදි බ්‍රාහ්මණ වර්ණ ධර්ම පිළිවෙළින් ඇතුලත් වර්ණය වන්නේ,

i. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර　　ii. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, ශුද්‍ර, වෛශ්‍ය

iii. බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර, ක්ෂත්‍රිය　　iv. බ්‍රාහ්මණ, ශුද්‍ර, වෛශ්‍ය, ක්ෂත්‍රිය

16. තුන්වන ධර්ම සංගායනාවෙන් පසු කාශ්මීර ගන්ධාර දේශයෙහි සඳහා ධර්ම ප්‍රචාරය සඳහා වැඩම කළේ,

i. මහාදේව මහ රහතන් වහන්සේ ය
ii. මජ්ඣන්තික මහ රහතන් වහන්සේ ය
iii. රක්ඛිත මහ රහතන් වහන්සේ ය
iv. මජ්ඣිම මහ රහතන් වහන්සේ ය

17. විශාකා මහෝපාසිකාව සසුනට පිදූ මිගාර මාතු ප්‍රාසාදය ලෙස හැඳින්වුයේ,

i. වේළුවනාරාමය යි
ii. පූර්වාරාමය යි
iii. ඝෝෂිතාරාමය යි
iv. ජේතවනාරාමය

18. උග්ග නම් සිටුවරයා සමඟ විවාහයට පත් සිටුදියණිය වූයේ,

i. සුමනා ය
ii. මහා සුභද්‍ර ය
iii. බන්ධුල මල්ලිකා ය
iv. චූල සුභද්‍ර ය

19. "ඤත්ති චතුත්ථකම්ම උපසම්පදා ක්‍රමය අනුදන වදාරණ තෙක්ම බුද්ධ කාලයෙහි භාවිත කළ උපසම්පදා ක්‍රමය වූයේ,

i. සරණාගමන උපසම්පදාව ය
ii. අට්ඨවාචක උපසම්පදාව ය
iii. ධූතෙන උපසම්පදාව ය
iv. එහි භික්ඛු උපසම්පදාව ය

20. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව ක්‍ෂත්‍රියයන්ට අයත් ස්වධර්මයකි

i. ඉගැන්වීම
ii. යාග කිරීම
iii. පූජා රක්‍ෂණය
iv. දන් පිළිගැනීම

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01.

i. බුදුරජාණන් වහන්සේගේ පිහිට ලද්දෝ සතර දෙනෙකු නම් කරන්න.
ii. ඉන් දෙදෙනෙකු පිළිබඳ විවරණයක් සපයන්න.

(ලකුණු 4 + 8 = 12)

02.

i. කො ඉමං පඨවිං විජේස්සති .....
ඵෙණුපමං කායමිමං විදිත්වා .....
පුප්ඵානි හෙව පචිනන්තං..... යන ගාථා අතුරින් දෙකක් සම්පූර්ණ කරන්න.

ii. ඉන් එක් ගාථාවක නිධාන කථාව ලියන්න.

(ලකුණු 8 + 4 = 12)

03.

i. අංගුත්තර නිකායේ පංචක නිපාතයේ සඳහන් වන පරිදි කාල දාන පහකි. එය නම් කරන්න.

ii. සප්පුරිස දාන සූත්‍රය ඇසුරු කරගෙන භුක්තානුමෝදනාවක් පිළියෙළ කරන්න.

(ලකුණු 5 + 7 = 12)

04.

i. සංඝ සාමග්‍රියෙහිලා මහා පරාක්‍රමබාහු රජතුමා සිදු කළ සේවාව අගයන්න.

ii. බ්‍රාහ්මදත්ත ජාතකයේ අතීත කථාව ලියන්න.

(ලකුණු 6 + 6 = 12)

05.

i. චතුර් ආශ්‍රම ධර්ම පිළිවෙලින් නම් කරන්න.

ii. භාරතීය බ්‍රාහ්මණ සමාජයේ වර්ණ භේදය පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 5 + 7 = 12)

06.

i. බම්භකත වග්ගයට අයත් ගමෙහි හැසිරීමෙහි ශික්ෂාපද පහක් ලියා දක්වන්න.

ii. ගමෙහි හැසිරීමේ දී බැහැර කළ යුතු අශෝභන හැසිරීම් මොනවාදැයි බම්භකත වග්ගය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 5 + 7 = 12)

07.

i. ''වේදනා ඤාණ සංඛාර'' යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. අහේතුක සිත් 18 බෙදා දක්වා අකුසල විපාක සිත් හත ලියන්න.

(ලකුණු 5 + 7 = 12)

08.

i. බුදුරජාණන් වහන්සේ වදාළ පරිදි භාවනාවට සුදුසු ස්ථාන තුන පිළිවෙලින් නම් කරන්න.

ii. ආනාපානාසති භාවනාව වඩන අයුරු පහදන්න.

(ලකුණු 5 + 7 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமை உடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍යවාර පරීක්ෂණය - 2022
இரண்டாம் தவணைப் பரீட்சை - 2022
Mid Year Term Test - 2022

පැය තුනයි

ත්‍රිපිටක ධර්මය    විභාග අංකය : ........................................    03 ශ්‍රේණිය

**I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. II කොටසේ තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I කොටස

**01. අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. සම්බුදු සසුනේ ප්‍රථම ආරාම පූජාව සිදු කළේ,
   i.අනේපිඬු සිටුතුමා ය.    ii. අජාසත්ත රජතුමා ය.
   iii. බිම්බිසාර රජතුමා ය.    iv. කොසොල් රජතුමා ය.

2. සිය මළ පුතු කරමත තබාගෙන බුදුරජාණන් වහන්සේ හමුවට පැමිණියේ,
   i. පටාචාරා ය.    ii. කිසාගෝතමී ය.
   iii. රජ්ජුමාලා ය.    vi. කුමාරකස්සප මාතාව ය.

3. බුදුරජාණන් වහන්සේ ප්‍රථම විනය ශික්ෂා පදය පනවා වදාළේ,
   i. සුභද්‍ර භික්ෂුව උදෙසා ය.    ii. උපාලි භික්ෂුව උදෙසා ය.
   iii. සුදින්න භික්ෂුව උදෙසා ය.    iv. ධනිය භික්ෂුව උදෙසා ය.

4. දුස්සීල භික්ෂූන් උපැවිදි කරවා ඔවුන්ට රජයේ තනතුරු පිරිනැමීම සිදු කළේ,
   i.මහසෙන් රජතුමා ය.    ii. මහා පරාක්‍රමබාහු රජතුමා ය.
   iii. මහා විජයබාහු රජතුමා ය.    vi. කිත්සිරිමෙවන් රජතුමා ය.

5. **"පාරගංගං ගමිස්සාමි ජොතෙතුං සාසනං ආහ"** යන උදාර සංකල්පය මුදුන්පත් කරගෙන ක්‍රියා කළේ,
   i. මහා පරාක්‍රමබාහු රජු ය.    ii. කාවන්තිස්ස රජු ය.
   iii. දුටුගැමුණු රජු ය.    iv. සද්ධාතිස්ස රජු ය.

6. බම්භකත වග්ගයට අයත් සේඛියා ගණන වන්නේ,
   i.18 කි.    ii.15 කි.    iii.10 කි.    vi. 09 කි.

7. **"න පලලත්ථිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා"** යන සේඛියා පාඨය ඇතුළත් වන්නේ,
   iii. කබල වග්ගයේ ය.    ii. උජ්ජග්ගික වග්ගයේ ය.
   iii. පාදුකා වග්ගයේ ය.    iv. බම්භකත වග්ගයේ ය.

8. පහත දැක්වෙන දාන අතරින් සප්පුරිස දානයක් නොවන්නේ,
   i. ශ්‍රද්ධාවෙන් දන් දීම.    ii. සුදුසු කාලයෙහි දන් දීම.
   iii. අපිළිවෙළින් යුතුව දන් දීම.    iv. තමා හා අනුන් නොගටා දන් දීම.

9. **"අයං බො දක්ඛිණා දින්නා"** යන ගාථා පාදය ඇතුළත් වන්නේ,
   i. සප්පුරිසදාන සූත්‍රයේ ය.    ii. තිරෝකුඩ්ඩ සූත්‍රයේ ය.
   iii. බහුධීතු සූත්‍රයේ ය.    iv. සුභාෂිත සූත්‍රයේ ය.

10. සෝමනස්ස සහගත දිට්ඨිගත සම්පයුත්ත අසංකාරික සිත හඳුන්වා ඇත්තේ,
    i. දෝස මූලික සිත්වල ය.    ii. මෝහ මූලික සිත්වල ය.
    iii. ලෝකෝත්තර සිත්වල ය.    IV. ලෝභ මූලික සිත්වල ය.

11. බුදු, පසේබුදු, මහරහත් යන උත්තමයන් වහන්සේලාට පමණක් පහළ වන සිත වනුයේ,
    I. මනෝද්වාරාවජ්ජන සිත    ii. හසිතුප්පාද සිත
    iii. සෝමනස්ස සහගත සන්තීරණ සිත    iv. පංචද්වාරාවජ්ජන සිත

12. සතර සතිපට්ඨානය නිවැරදිව ඇති වරණය වන්නේ,
    i. කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා.
    ii. කායානුපස්සනා, චිත්තානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා.
    iii. කායානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා, චිත්තානුපස්සනා.
    iv. චිත්තානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා, කායානුපස්සනා.

13. ධම්මපදයේ පුප්ඵ වග්ගයට අයත් ගාථා හා නිධාන කථා ප්‍රමාණය නිවැරදිව ඇති වරණය වන්නේ,
    i.ගාථා දාසයකි, නිදාන කතා 10 කි.    ii.ගාථා පහළොවකි, නිදාන කතා 12 කි.
    iii.ගාථා දසයකි, නිදාන කතා 12 කි.    iv ගාථා දහසයකි, නිදාන කතා 13කි.

14. ආනාපානසති භාවනාව සඳහා සුදුසු ස්ථානයක් වන්නේ, මින් කවරක්ද ?
    i. ගස් බෙනයක් තුළ ය.    ii. සතර ඉරියව්ව තුළ ය.
    iii. කලබලකාරී පරිසරයක් තුළ ය.    iv. ශූන්‍යාගාර තුළ ය.

15. මහා බ්‍රහ්මයාගේ බාහු වලින් උපන් පිරිස වන්නේ,
    i. බ්‍රාහ්මණ පිරිස ය.    iii. ක්ෂත්‍රිය පිරිස ය.
    iii. ශුද්‍ර පිරිස ය.    Iv. වෛශ්‍ය පිරිස ය.

16. **ආශ්‍රම ධර්ම** පිළිවෙළින් අයත් වන වරණය වන්නේ,
    i. බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි.    ii. බ්‍රහ්මචාරී, වානප්‍රස්ථ, ගෘහස්ථ, සන්‍යාසි.
    iii. ගෘහස්ථ, බ්‍රහමචාරී, සන්‍යාසි, වානප්‍රස්ථ.    iv. බ්‍රහ්මචාරී, වානප්‍රස්ථ, සන්‍යාසි, ගෘහස්ථ.

17. රාධ බමුණා උපසම්පදා කිරීම සඳහා වදාළ උපසම්පදා ක්‍රමය වනුයේ,
    i. එහි භික්ෂු උපසම්පදාව.    ii. සරණාගමන උපසම්පදාව.
    iii. අට්ඨවාචක උපසම්පදාව.    iv. ඤත්තිචතුත්ථ කම්ම උපසම්පදාව.

18. දම්සක් පැවතුම් සූත්‍ර දේශනාව අවසානයේ ප්‍රතිඵලයක් ලෙස, ජීවිතයේ යථාර්ථය පිළිබඳ දහම අවබෝධ කරගත් තවුසා වන්නේ,
    i. අස්සජි තවුසා ය.    ii. කොණ්ඩඤ්ඤ තවුසා ය.
    iii. වප්ප තවුසා ය.    iv. භද්දිය තවුසා ය.

19. විශාඛා උපාසිකාව සසුනට පිදූ ආරාමය හැඳින්වූයේ,
    I.ජේතවනාරාමය ලෙස ය.    ii. පූර්වාරාමය ලෙස ය.
    iii. කුක්කුටාරාමය ලෙස ය.    iv. ඝෝෂිතාරාමය ලෙස ය.

20. සතර ඉද්ධිපාද දැක්වෙන වරණය වන්නේ,
    i. ඡන්ද, චිත්ත, සද්ධා, වීමංසා.
    ii. වීමංසා, ඡන්ද, චිත්ත, විරිය.
    iii. ඡන්ද, චිත්ත, විරිය, වීමංසා.
    iv. චිත්ත, විරිය, වීමංසා, ඡන්ද.

(ලකුණු 2x20 = 40)

## **II** කොටස

2. i. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රධානත්වය දැරූ භික්ෂූන් වහන්සේ හා දායකත්වය දැරූ රජතුමාගේ නම් ලියන්න.

   ii. මිහිඳු මහරහතන් වහන්සේගේ ලංකාගමනයෙන් පසු සිදු වූ වැදගත් සිදුවීම් **හතරක්** ලියන්න.

(ලකුණු 4+8 = 12)

3. I. බ්‍රහ්මදත්ත ජාතකයට අනුව හැඬීම් වර්ග **දෙක** නම් කරන්න.

   ii. **"යමෙකු පුරුද්දක් ලෙස නිතර ඉල්ලයි නම් පරිහානියට හේතු වේ." බ්‍රහ්මදත්ත ජාතකය** ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 4+8 = 12)

4. i. "බම්භකත", "උජ්ජග්ගික" යන වචන දෙකේ අර්ථ ලියන්න.

   ii ."බම්භකත" වර්ගයේ සේඛියා **හතරක්** අර්ථය සහිතව ලියන්න.

(ලකුණු 4+8 = 12)

5. i. ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ **හතරක්** ලියන්න.

   ii. පහත සඳහන් ගාථා අතරින් දෙකක් සම්පූර්ණ කරන්න.

      1. අනවට්ඨිත චිත්තස්ස ............
      2. ඵේණූපමං කායමිමං විදිත්වා .............
      3. න පරේසං විලෝමානි ...........
      4. යථාපි පුප්ඵරාසිම්හා ..........

(ලකුණු 4+8 = 12)

6. i. බ්‍රාහ්මණ **ස්වධර්ම හතරක්** ලියන්න.

   ii. බමුණු දහමෙහි ඉගැන්වෙන **ආපත් ධර්මවල** ඇති අගය පැහැදිලි කරන්න.

(ලකුණු 4+8 = 12)

7. I. ආනාපානසති භාවනාවේ පූර්ව කෘත්‍ය ලියන්න.

   II. ආනාපානසති භාවනාව වඩන ආකාරය පියවර අනුව පැහැදිලි කරන්න.

(ලකුණු 4+8 = 12)

[සියලුම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு
Ministry of Education – Division of Piriven Education

මධ්‍ය වාර පරීක්ෂණය - 2023
இரண்டாம் தவணைப் பரீட்சை - 2023
**Mid Year Term Test - 2023**

පැය තුනයි

**ත්‍රිපිටක ධර්මය** විභාග අංකය : ......................... **03 ශ්‍රේණිය**

- **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II වන කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

## I - කොටස

- **අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් විසිවන වස වැඩ සිටියේ බිම්බිසාර රජු විසින් පූජා කරන ලද,
   i. ජේතවනාරාමයේ ය.
   ii. පූර්වාරාමයේ ය.
   iii. වේළුවනාරාමයේ ය.
   iv. ඝෝෂිතාරාමයේ ය.

2. බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා කහවණු ලබා ගැනීමේ අදහසින් වෙහෙරට ගියේ,
   i. කාල සිටු පුත්‍රයා ය.
   ii. අනේපිඬු සිටු පුත්‍රයා ය.
   iii. මිගාර සිටු පුත්‍රයා ය.
   iv. පූර්ණවර්ධන සිටු පුත්‍රයා ය.

3. පැවිදි වී ටික දිනකින් දරුවෙකු ලැබීමට සිටින බව දැන ගත් දෙව්දත් තෙරුන්, සිවුරු හැර යන ලෙස නියම කළේ,
   i. පටාචාරා තෙරණියට ය.
   ii. කිසාගෝතමී තෙරණියට ය.
   iii. රජ්ජුමාලා තෙරණියට ය.
   iv. කුමාරකස්සප මාතා තෙරණියට ය.

4. ආනන්ද බෝධිය රෝපණයට දායක වූ රජතුමා වන්නේ,
   i. අජාසත්ත රජු ය.
   ii. සුප්‍රබුද්ධ රජු ය.
   iii. කොසොල් රජු ය.
   iv. බිම්බිසාර රජු ය.

5. උජ්ජග්ගික වග්ගයට අයත් සේඛියා ගණන වන්නේ,
   i. නවයකි.
   ii. දොළහකි.
   iii. දහයකි.
   iv. පහළොවකි.

6. මිහිඳු මහරහතන් වහන්සේගේ ආචාර්යයන් වහන්සේ වූයේ,
   i. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ය.
   ii. රක්ඛිත මහරහතන් වහන්සේ ය.
   iii. මහාදේව මහරහතන් වහන්සේ ය.
   iv. මජ්ඣන්තික මහරහතන් වහන්සේ ය.

7. **"මාගේ මෙම ව්‍යායාමය රජ සැප පිණිස නොව, සම්බුදු සසුන බැබළවීම පිණිස යි"** යන උදාර සංකල්පයෙන් කටයුතු කළේ,
   i. මහා පරාක්‍රමබාහු රජතුමා ය.
   ii. දුටුගැමුණු රජතුමා ය.
   iii. කිත්සිරිමෙවන් රජතුමා ය.
   iv. කාවන්තිස්ස රජතුමා ය.

8. **"න ඔගුණ්ඨිතො අන්තරඝරේ ගමිස්සාමීති සික්ඛා කරණීයා"** යන සේඛියා පාඨය ඇතුළත් වන්නේ,
   i. උජ්ජග්ගික වග්ගයේ ය.
   ii. කබළ වග්ගයේ ය.
   iii. ඛම්භකත වග්ගයේ ය.
   iv. පාදුකා වග්ගයේ ය.

9. තිරෝකුඩ්ඩ සූත්‍රයේ සඳහන් පරිදි, අනුන් දුන් පිනෙන් ජීවත් වන්නෝ .................... නම් වේ.
   i. වන්තාස
   ii. පරදත්තූප ජීවී
   iii. නිජ්ඣාම තන්හික
   iv. ඛුප්පිපාසික

10. සමුද්ද වාණිජ ජාතකයට අනුව **"එදා දූපත හැර නොයන ලෙස බොරු කී දේවතාවා වූයේ"** වර්තමානයේ,
   i. සැරියුත් තෙරුන් ය.
   ii. දෙව්දත් තෙරුන් ය.
   iii. සුභද්‍ර භික්ෂුව ය.
   iv. කෝකාලික භික්ෂුව ය.

11. ඇතැම් අරමුණු පඤ්චද්වාරයට යොමු නොවී කෙලින් ම මනෝද්වාරයට ම පැමිණෙයි. එනම් කල්පනාවට යොමු වීම යි, සිහි කිරීම යි. එයට,
   i. හසිතුප්පාද සිත යැයි කියනු ලැබේ.
   ii. මනෝද්වාරාවජ්ජන සිත යැයි කියනු ලැබේ.
   iii. පඤ්චද්වාරාවජ්ජන සිත යැයි කියනු ලැබේ.
   iv. කාමාවචර කුසල සිත යැයි කියනු ලැබේ.

12. අනුන්ගෙන් යම් යම් දේවල් ඉල්ලීම භික්ෂුවගේ ආත්ම ගෞරවයට බරපතල හානියක් බව පවසා, අලවි නුවර අග්ගාළව නම් චෛත්‍යය පිහිටි ස්ථානයේ දී ...................... ජාතකය දේශනා කළ සේක.
   i. මහා ධර්මපාල
   ii. ක්ෂාන්තිවාදී
   iii. සමුද්ද වාණිජ
   iv. බ්‍රහ්ම දත්ත

13. ධම්ම පදයේ පුප්ඵ වග්ගයට අයත් ගාථා ප්‍රමාණය ඇතුළත් නිවැරදි වරණය වන්නේ,
   i. දහසය කි.
   ii. පහළොව කි.
   iii. එකොළස කි.
   iv. දහය කි.

14. බමුණු දහමට අනුව මහා බ්‍රහ්මයාගේ මුඛයෙන් උපන් පිරිස අයත් වරණය වන්නේ,
   i. ශුද්‍ර පිරිස ය.
   ii. බ්‍රාහ්මණ පිරිස ය.
   iii. ක්ෂත්‍රිය පිරිස ය.
   iv. වෛශ්‍ය පිරිස ය.

15. ධරමාන බුදුන් දවස සාමණේර පැවිද්ද ආරම්භ වන්නේ …………………….. භික්ෂුවගෙනි.
   i. සුනීත
   ii. කුමාරකස්සප
   iii. සෝපාක
   iv. රාහුල

16. පංචබල පිළිවෙළින් අයත් වන වරණය වන්නේ,
   i. සද්ධා, සති, විරිය, සමාධි, පඤ්ඤා
   ii. විරිය, සමාධි, සති, පඤ්ඤා, සද්ධා
   iii. විරිය, සද්ධා, සති, සමාධි, පඤ්ඤා
   iv. සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා

17. දානයේ දී, දුන්දේ සිතින් අත් හැර නැවත ඒ පිළිබඳ තැකීමක් නොකරන පුද්ගලයා හැඳින්වෙන්නේ,
   i. පයතපාණී නමිනි.
   ii. මුක්තචාගෝ නමිනි.
   iii. යාචයොගෝ නමිනි.
   iv. වොස්සග්ගරතො නමිනි.

18. ගාථා එකොළසකින් හා නිදාන කතා නවයකින්, සිත පිළිබඳ ප්‍රධාන වශයෙන් කරුණු ඇතුළත් වන්නේ ධම්මපද ........................... වග්ගයේ ය.
   i. යමක
   ii. අප්පමාද
   iii. චිත්ත
   iv. පුප්ඵ

19. ගිහි දිවියක දුක්බර පුවත පිළිබඳ විස්තර වන "බහුධීතු සූත්‍රය" අයත් වන්නේ,
   i. ඛුද්දක නිකායට ය.
   ii. දීඝ නිකායට ය.
   iii. සංයුත්ත නිකායට ය.
   iv. මජ්ඣිම නිකායට ය.

20. නවරට ධර්ම දූත මෙහෙවරේ දී තම්බපණ්ණි දීපයට ධර්මය රැගෙන ගියේ,
   i. මහින්ද තෙරුන් වහන්සේ ය.
   ii. මජ්ඣිම තෙරුන් වහන්සේ ය.
   iii. රක්ඛිත තෙරුන් වහන්සේ ය.
   iv. මහාදේව තෙරුන් වහන්සේ ය.

**(ලකුණු 2x20 = 40)**

## II - කොටස

2. i. පහත සඳහන් ගාථා අතරින් දෙකක් සම්පූර්ණ කරන්න.

   I. යථාපි හමරෝ පුප්ඵං ............

   II. යථාසඞ්ඛාරධානස්මිං ............

   III. කුම්භූපමං කායමිමං විදිත්වා ..............

   IV. කෝ ඉමං පඨවිං විජෙස්සති .............

   ii. ඉන් එක් ගාථාවකට අදාළ නිදාන කතාව ලියන්න.

**(ලකුණු 4x3 = 12)**

3. i. **"නහි නූනිමස්ස සමණස්ස බලිවද්දා චතුද්දස -
   අජ්ජ සට්ඨී න දිස්සන්ති තේනායං සමණෝ සුඛී"** යන ගාථාවේ සරල අදහස ලියන්න.

   ii. **"බහු ධීතු සූත්‍රය"** ඇසුරින් බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.

**(ලකුණු 4+8 = 12)**

4. i. බමුණු දහමෙහි ඉගැන්වෙන **"ආශ්‍රම ධර්ම"** හතර නම් කරන්න.

   ii. ඉන් **දෙකක්** වෙන වෙන ම පැහැදිලි කරන්න.

**(ලකුණු 4+8 = 12)**

5. i. **"පාරාජික පාළිය"** ට අනුව විනය නීති පැනවීම සඳහා හේතු වූ කරුණු හතරක් ලියන්න.

   ii. ඉන් **දෙකක්** වෙන වෙන ම පැහැදිලි කරන්න.

**(ලකුණු 4+8 = 12)**

6. i. **"පංච නීවරණ"** පිළිවෙළින් ලියන්න.

   ii. **"ආනාපාන සති භාවනාව"** වඩන ආකාරය පියවර අනුව විස්තර කරන්න.

**(ලකුණු 4+8 = 12)**

7. i. **"සතර පරමාර්ථ"** පිළිවෙළින් ලියන්න.

   ii. **"ලෝභ මූලික සිත් අට"** පිළිවෙළින් ලියන්න.

**(ලකුණු 4+8 = 12)**

******************

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය / Ministry of Education - Division of Piriven Education / கல்வி அமைச்சு - சிறப்புக் கல்விப் பிரிவு

| 03 | S | I |
|---|---|---|

# මූලික පිරිවෙන් මධ්‍යවාර පරීක්ෂණය - 2024

## 03 ශ්‍රේණිය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛතාව දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## (03) ත්‍රිපිටක ධර්මය

**සැලකිය යුතුයි :**
*** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100ක් ලැබේ.**
*** දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.**
*** I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසින් තෝරා ගත් ප්‍රශ්න පහකට ද පමණක් පිළිතුරු සපයන්න.**

---

- **අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. කොසොල් මහරජතුමා සමඟ විවාහ වූ ශාක්‍ය වංශික කුමාරිකාවගේ නම කුමක් ද ?,
   1. සාමා ය.
   2. මල්ලිකා ය.
   3. වාසභඛත්තියා ය.
   4. චූල සුභද්‍රා ය.

2. තෙවන ධර්මසංගායනාවෙන් පසු ප්‍රදේශ නවයකට ධර්ම දූත ප්‍රචාරය සිදු කරන ලදී. **වනවාසී දේශයට** වැඩම කරන ලද පිරිසේ ප්‍රධානත්වය දරන ලද්දේ,
   1. රක්ඛිත මහරහතන් වහන්සේ ය.
   2. මහාදේව මහරහතන් වහන්සේ ය.
   3. මහින්ද මහරහතන් වහන්සේ ය.
   4. මජ්ඣිම මහරහතන් වහන්සේ ය.

3. “බඹරා මලේ පැහැය හා සුවඳ නො නසමින් පැණි ගෙන යන්නාක් මෙන්, භික්ෂුව විසින් දායකයා සමග ...................... කාර්යයේ වුව ද සිහිනුවණින් කටයුතු කළ යුතු ය.
   1. ධර්මය දේශනා කිරීමේ
   2. පැවිදි බවට පත් වීමේ
   3. ධනය ඉපයීමේ
   4. සිව්පසය සපයා ගැනීමේ

4. පොලොන්නරු රාජධානිය කේන්ද්‍ර කොට ලක්දිව පාලනය කළ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූ පළමු පරාක්‍රමබාහු මහ රජතුමාගේ දෙමාපියන්ගේ නම් නිවැරදි ව ඇතුළත් වරණය වන්නේ,
   1. මහා විජයබාහු රජු හා මිත්තා බිසව
   2. මානාභරණ රජු හා රත්නාවලී බිසව
   3. මහා විජයබාහු රජු හා තිලෝකසුන්දරී බිසව
   4. මානාභරණ රජු හා මිත්තා බිසව

5. පිණ්ඩපාතය පිළිගැනීම සම්බන්ධ සේඛියා ධර්ම අතර ඛම්භකත වග්ගයට අයත් **සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා** යන්නෙහි සරල අර්ථයෙන් කිය වෙන්නේ,
   1. සිහි කල්පනාවෙන් ආහාර පිළිගත යුතු බව ය.
   2. පාත්‍රයේ දානය පිළිගත යුතු බව ය.
   3. සකස් කොට ආහාර පිළිගත යුතු බව ය.
   4. බතට සෑහෙන ව්‍යඤ්ජන පිළිගත යුතු බව ය.

6. වෙනත් සත්ත්වයන්ගේ කෙළ, සෙම්, සොටු, වමනය හෝ ශරීරවලින් ගලන ලේ සැරව ආදිය අමෘතයක් සේ අනුභව කරමින් දුක්ඛිත ව ජීවත්වන ප්‍රේත කොට්ඨාසය ................................ නම් වේ.
   1. නිජ්ඣාම තණ්හික
   2. වන්තාස
   3. ඛුප්පිපාසික
   4. පරදත්තූපජීවි

7. වාග සම්පදාවට අනුව **"වොස්සග්ගරතෝ"** යන්නෙහි සරල අදහස ඇතුළත් වරණය වන්නේ,
   1. දීමට ම සෝදා ගත් අත් ඇති
   2. යදින්නට, ආධාර ඉල්ලන්නට සුදුසු
   3. තමාසතු දේ අත්හැරීමෙහි යෙදුණු
   4. දුන් දේ සිතින් අතහැර දෙන සුලු

8. ලෝභ, ද්වේෂ, මෝහ යන අකුසල මූල තුනට අනුව හටගන්නා අකුසල් සිත් ගණන කොපමණ ද?
   1. දහයකි
   2. දොළොසකි
   3. දහතුනකි
   4. සොළොසකි

9. ප්‍රාතිමෝක්ෂයේ සේඛියා හැත්තෑ පහ විවිධ තේමා අනුව කොටස් හතකට බෙදා ඇත. එහි ගොදුරු ගමෙහි හැසිරීමේ දී හා වැඩ හිඳීමේ දී ක්‍රියා කළ යුතු ආකාරය සඳහන් ව ඇත්තේ ........................... වග්ගයේ ය.
   1. ඛම්භකත
   2. සුරු සුරු
   3. උජ්ජග්ගික
   4. පාදුකා

10. බහුධීතු සූත්‍රයේ සඳහන් භාරද්වාජගොත්ත බමුණා පැවිදි වීමෙන් පසු, තම ගිහි ජීවිතයේ තිබූ ණය බරින් නිදහස් වීම සඳහා උපකාර කරන ලද්දේ,
   1. අනේපිඬු සිටුතුමා විසිනි.
   2. කොසොල් මහරජතුමා විසිනි.
   3. බිම්බිසාර මහරජතුමා විසිනි.
   4. විසාකා මහෝපාසිකාව විසිනි.

11. ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල මූල හෝ අලෝභ, අද්වේෂ, අමෝහ යන කුසල මූල හයෙන් එකක් හෝ නිසි පරිදි නො යෙදෙන සිත් අභිධර්මය තුළ හඳුන්වා ඇත්තේ,
   1. කාමාවචර සිත් යනුවෙනි.
   2. රූපාවචර සිත් යනුවෙනි.
   3. අහේතුක සිත් යනුවෙනි.
   4. අරූපාවචර සිත් යනුවෙනි.

12. බුද්ධෝපස්ථායක මේඝිය තෙරුන් වහන්සේ අරමුණු කොට ගෙන බුදුන් වහන්සේ දේශනා කරන ලද ගාථාවේ පළමු පාදය වන්නේ,
   1. සුදුද්දසං සුනිපුනං....
   2. දූරඞ්ගමං එකචරං....
   3. වාරිජොව ථලෙ ඛිත්තො....
   4. ඵන්දනං චපලං චිත්තං....

13. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත කෘති පමණක් ඇතුළත් වරණය වන්නේ,
   1. කව්සිළුමිණ, විශුද්ධි මාර්ග සන්නය
   2. බුදුගුණාලංකාර, ලෝවැඩ සඟරාව
   3. කාව්‍යශේඛරය, පරවි සංදේශය
   4. මුනිගුණාලංකාර, සාරාර්ථ සංග්‍රහය

15. "සිතෙහි විසිරුණු බව හා කුකුස" යන සරල අදහස ඇතුළත් නීවරණ ධර්මය වන්නේ,
   1. කාමඡන්දය යි.
   2. ථීන මිද්ධය යි.
   3. උද්දච්ච කුකුච්ඡය යි.
   4. විචිකිච්ඡාව යි.

16. පඤ්ච බල ධර්ම පිළිවෙළින් ඇතුළත් වරණය වන්නේ,
   1. රූප, වේදනා, සංඥා, සංඛාර
   2. සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා
   3. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ
   4. සති, ධම්මවිචය, විරිය, පීති, සමාධි

17. බුදු, පසේ බුදු, මහරහතන් වහන්සේලා තමන් ලැබූ නිවන් සුවය මෙලොව දී ම විඳිමින් වාසය කිරීම හැඳින්වෙන්නේ,
   1. අනුපදිසේස පරිනිර්වාණය නමිනි.
   2. සුඛ ඒකග්ගතාව නමිනි.
   3. නිරෝධ සමාපත්තිය නමිනි.
   4. උපේක්ඛා වේදනාව නමිනි.

18. ධම්ම පදයේ චිත්ත වග්ගයට අයත් ගාථා ප්‍රමාණය හා නිදාන කතා ප්‍රමාණය නිවැරදි ව ඇතුළත් වරණය වන්නේ,
   1. ගාථා 16 යි කතා 12 යි.
   2. ගාථා 11 යි කතා 09 යි.
   3. ගාථා 16 යි කතා 15 යි.
   4. ගාථා 14 යි කතා 11 යි.

19. භාරතීය බ්‍රාහ්මණ සමාජයේ චතුර් වර්ණය අතරින් වෛශ්‍යයින්ට පමණක් අයත් ස්වධර්ම ඇතුළත් වරණය තෝරන්න.

1. ඉගෙන ගැනීම, ඉගැන්වීම
2. වෙළෙඳාම, කෘෂිකර්මය
3. යාග කිරීම, කාමයෙහි නො ඇලීම
4. ඉගෙන ගැනීම, දන් දීම

20. බුදුන් වහන්සේ විසින් භික්ෂූන්ට වාසය සඳහා අනුදැන වදාළ ආරාම අතර, **දැව හා කොළ අතුවලින් සැකසුණු පර්ණශාලා හෙවත් පන්සල්** ................. නම් වේ.

1. අඩ්ඪයෝග
2. පාසාද
3. විහාර
4. හම්මිය

(ලකුණු 2 X 20 = 40)

## II - කොටස

2. i. පහත සඳහන් ගාථාවලින් දෙකක් සම්පූර්ණ කරන්න.

i. අචිරං වතයං කායො ...
ii. ඵෙණූපමං කායමිමං විදිත්වා ...
iii. න පරෙසං විලොමානි ...
iv. එවං සඞ්ඛාර භූතෙසු ...

ii. ඉන් එක් ගාථාවක නිදාන කතාව ලියන්න. (8+4 = 12)

3. i. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලා විෂයෙහි දේශනා කළ ඕවාද ප්‍රාතිමෝක්ෂය ලියන්න.
ii. බුදුරජාණන් වහනසේගේ මහාකරුණාව උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.
(4+8 = 12)

4. i. මිහිඳු මහ රහතන් වහන්සේගේ වැඩමවීමෙන් පසු සිදු වූ වැදගත් සිදුවීම් හතරක් ලියන්න.
ii. දුටුගැමුණු රජතුමාගේ සාසනික මෙහෙවර උදාහරණ තුනක් ඇතුළත් වන සේ විස්තර කරන්න.
(4+8 = 12)

5. i. චතුරාරක්ඛා භාවනාව නම් කරන්න.
ii. ආනාපානසති භාවනාවේ පූර්වකෘත්‍ය පැහැදිලි කරන්න.
(4+8 = 12)

6. i. බුදුරජාණන් වහන්සේ විසින් සේඛියා පැනවීමට මුල් වූ හේතු පැහැදිලි කරන්න.
ii. ආචාරශීලී භික්ෂු සමාජයක් ගොඩනැගීම සඳහා සේඛියා අනුගමනය කිරීමේ ඇති වටිනාකම පැහැදිලි කරන්න.
(4+8 = 12)

7. i. සතර පරමාර්ථ නම් කරන්න.
ii. ඒවා වෙන වෙන ම විස්තර කරන්න. (4+8 = 12)

8. i. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව චතුර් වර්ණය නම් කරන්න.
ii. යහපත් පුරවැසියෙක් ගොඩ නැගීම සඳහා ආශ්‍රම ධර්මවල උපයෝගීතාව පැහැදිලි කරන්න. (4+8 = 12)

9. i.සප්පුරිස දාන සූත්‍රයට අනුව සප්පුරිස දාන පහකි. ඉන් හතරක් නම් කරන්න.
ii. එම සූත්‍රය ආශ්‍රයෙන් පුණ්‍යානුමෝදනාවක් පිළියෙල කරන්න.
(4+8= 12)

# ත්‍රිපිටක ධර්මය

## අවසාන වාර ප්‍රශ්න පත්‍ර - 3 ශ්‍රේණිය

| | |
|---|---|
| | **මූලික පිරිවෙන් අවසානවාර පරීක්ෂණය - 2018** |
| | Primary Piriven Year End Test - 2018 |
| | **ශ්‍රේණිය 03/Grade 03** |
| සියලු ම හිමිකම් ඇවිරිණි<br>All Rights Reserved | ත්‍රිපිටක ධර්මය<br>Thripitaka Dharmaya |
| | කාලය : පැය තුනයි<br>**Time : Three Hours** |

ත්‍රිපිටක ධර්මය

I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II, III කොටස්වලින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ තවත් ප්‍රශ්න පහකට ද පිළිතුරු සපයන්න.

## I කොටස

**නිවැරැදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. අජාසත්ත රජතුමා පාඨලී නම් ගමෙහි නගරයක් ඉදිකිරීමට භාර කරන ලද්දේ කුමන ඇමතිවරුන්ට ද?

i. සුනිධ, සුභද්‍ර ii. සුනිධ, වස්සකාර iii. වස්සකාර, ජන්ත iv. සුනීධ, යස

02. ධර්මාශෝක අධිරාජ්‍යයාගේ කාලයේ දඹදිව අගනුවර ලෙස ප්‍රසිද්ධියට පත් වූයේ

i. විශාලා නුවර ය ii. උදේනි නුවර ය iii. පාඨලී නුවර ය iv. රජගහනුවර ය

03. "මම බුදුන් මරා බුදු වන්නෙමි. ඔබ ද, පියා මරා රජවන්නයැ යි" කීවේ,

i. දෙව්දත් තෙරුන්, අජාසත් රජුට ය
ii. දෙව්දත් තෙරුන්, සුප්‍රබුද්ධ රජුට ය
iii. දෙව්දත් තෙරුන්, කොසොල් රජුට ය
iv. දෙව්දත් තෙරුන්, ලිච්ඡවී රජුට ය

04. අතීත ත්‍රි සිංහලය පිළිවෙළින් හඳුන්වා ඇති වරණය වන්නේ,

i. රුහුණු, මායා, පිහිටි ii. මායා, රුහුණු, පිහිටි iii. පිහිටි, රුහුණු, මායා iv. රුහුණු, පිහිටි, මායා

05. "බිසොවට පළමු රත්නාවලී නම් සොඳුරු" යන කවිය ඇතුළත් සංදේශය වන්නේ,

i. හංස සංදේශය ii. ගිරා සංදේශය iii. තිසර සංදේශය iv. සැළලිහිණි සංදේශය

06. "ඉවසීම බෝසත් ගුණයකි" යන කියමන අර්ථවත් වන්නේ,

i. බ්‍රහ්මදත්ත ජාතකයේ ය
ii. සමුද්දවාණිජ ජාතකයේ ය
iii. ක්ෂාන්තිවාදී ජාතකයේ ය
iv. සේරිවාණිජ ජාතකයේ ය

07. "න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං දෙසිස්සාමී ති සික්ඛා කරණීයා" යන සේඛියා ශික්ෂා පදය සඳහන් ව ඇත්තේ,

i. පාදුකා වර්ගයේ ය ii. සුරු සුරු වර්ගයේ ය iii. ඛම්භකත වර්ගයේ ය iv. කබල වර්ගයේ ය

08. පහත සඳහන් දානයන් අතුරින් සප්පුරිස දානයක් නො වන්නේ,

i. ශ්‍රද්ධාවෙන් දන් දීම  ii. සුදුසු කාලයෙහි දන් දීම
iii. දෙන දෙයෙහි ඇල්මක් ඇතිව දන් දීම  iv. සකස්කොට දන් දීම

09. ''පියවාච මේ භාසෙය්‍ය යා වාචා පතිනන්දිතා'' යන ගාථා පාඨය ඇතුළත් සූත්‍රය වන්නේ,

i. සුභාසිත සූත්‍රය  ii. තිරෝකුඩ්ඩ සූත්‍රය  iii. බහුපිතු සූත්‍රය  iv. සප්පුරිසදාන සූත්‍රය

10. පඨමජ්ඣාන කුසල සිතට මූලික වන ධ්‍යාන සිත් පිළිවෙළින් ඇත්තේ,

i. විචාර, විතක්ක, පීති, සුඛ, ඒකග්ගතා
ii. පීති, විචාර, විතක්ක, සුඛ, ඒකග්ගතා
iii. විතක්ක, විචාර, සුඛ, පීති, ඒකග්ගතා
iv. විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා

11. සක්කාය දිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, යන සංයෝජන සිඳලීමෙන් ලබාගත හැකි මාර්ග ඵලය,

i. සෝවාන් මාර්ග ඵලය යි  ii. අනාගාමි මාර්ග ඵලය යි
iii. සකදාගාමි මාර්ග ඵලය යි  iv. අරහත් මාර්ග ඵලය යි

12. සතර සතිපට්ඨානය අනුපිළිවෙළින් දක්වා ඇති වරණය වන්නේ,

i. වේදනානුපස්සනා, කායානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා
ii. කායානුපස්සනා, වේදනානුපස්සනා, ධම්මානුපස්සනා, චිත්තානුපස්සනා
iii. කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා
iv. ධම්මානුපස්සනා, වේදනානුපස්සනා, කායානුපස්සනා, චිත්තානුපස්සනා

13. ධම්මපදයේ තෙවන වර්ගය වන චිත්ත වග්ගයට අයත් ගාථා ප්‍රමාණය,

i. දහයකි  ii. එකොළහකි  iii. දොළහකි  iv. පහළොවකි

14. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් වැඩ සිටි පිරිවෙන වන්නේ,

i. පද්මාවතී පිරිවෙන  ii. නියමකන්දේ පිරිවෙන
iii. සුනේත්‍රාදේවි පිරිවෙන  iv. විජයබා පිරිවෙන

15. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ධර්මදූතයන් වහන්සේලා පිටත් කරන ලද රටවල් ගණන,

i. නවයකි  ii. දහයකි  iii. අටකි  iv. දොළසකි

16. මිහිඳු මහරහතන් වහන්සේගේ ධාතු නිදන් කොට අනුරාධපුර චේතියගිරියෙහි හා ලක්දිව තවත් ස්ථාන කිහිපයක ස්තූප ඉදිකළ රජතුමා වන්නේ,

i. දේවානම්පිය තිස්ස රජු ය  ii. උත්තිය රජු ය  iii. වලගම්බා රජු ය  iv. දුටුගැමුණු රජු ය

17. ''බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන්නට පෙර කෙසේ හෝ මම රහත්වෙමියි'' සිතා එසේ කළේ,

i. ධම්මාරාම භික්ෂුව යි  ii. සුභද්‍ර භික්ෂුව යි  iii. රාධ භික්ෂුව යි  [illegible]ාන්ද භික්ෂුව යි

18. බුදුරජාණන් වහන්සේ අවසන් වරට පැන් පහසු වූයේ,

i. නේරංජනා නදියෙහි ii. අනෝමා නදියෙහි iii. කුකුත්ථා නදියෙහි iv. අචිරවතී නදියෙහි

19. බ්‍රාහ්මණ ස්වධර්ම අනුව ක්ෂත්‍රියන්ට පැවරී ඇති වගකීමක් නොවන්නේ,

i. ඉගැන්වීම ii. දන්දීම iii. යාග කරවීම iv. ප්‍රජා රක්ෂණය

20. "සංඝෙ ගොතමී දෙහි" යන වැකිය බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රකාශ කරන ලද්දේ,

i. යසෝදරාවනට ii. ප්‍රජාපතී ගෝතමියනට iii. විශාඛාවනට iv. සුජාතාවනට

(ලකුණු 2×20=40)

## II කොටස

1. i. බුදුරජාණන් වහන්සේ පිරිනිවීමට පෙර පිරිනිවන් පා වදාළ මහ රහත් භික්ෂු භික්ෂුණීන් සිව්නමකගේ නම් ලියන්න.

ii. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවට පාත්‍ර වූ දෙදෙනෙකුගේ චරිතය පිළිබඳ ව කෙටි විවරණ සපයන්න.

(ලකුණු 4+8=12)

2. i. අචිරං වතයං කායො ........
අප්පමත්තො අයං ගන්ධො ......
තෙසං සම්පන්න සීලානං ......... යන ගාථා අතුරින් දෙකක් සම්පූර්ණ කරන්න.

ii. ඉන් එක් ගාථාවක නිදාන කථාව ලියන්න.

(ලකුණු 6+6=12)

3. i. සුභාසිත සූත්‍රයට අනුව යහපත් වචනයක තිබිය යුතු අංග පහකි. එය නම් කරන්න.

ii. ප්‍රිය වචන කථා කරන භික්ෂූන් වහන්සේ කාගේත් ප්‍රසාදයට පත් වේ. මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 5+7=12)

4. i. සව්සත කෙළ පැමිණි යන කවිය සම්පූර්ණ කරන්න.

ii. මිහිඳු මහරහතන් වහන්සේගේ ආගමනයෙන් අප රටට උරුම වූ දායාද පිළිබඳ ව විස්තර කරන්න.

(ලකුණු 5+7=12)

## III කොටස

5\. i. ඉවසීම නොමැතිකමින් තම ජීවිතයට ඇතිවන ගැටලු හතරක් ලියන්න.

ii. ''ඉවසීම බෝසත් ගුණාංගයකි'' ක්ෂාන්තිවාදි ජාතකය ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 4+8=12)

6\. i. චතුරාර්ය සත්‍යය නම් කරන්න.

ii. තෘෂ්ණාව දුකට හේතුව යි. දෙවන ආර්ය සත්‍යය ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 4+8=12)

7\. i. පාදුකා වග්ගයට අයත් සේඛියා ශික්ෂා පහක් ලියා දක්වන්න.

ii. ධර්ම දේශනාවක දී සිරිත් විරිත්වල වැදගත්කම සේඛියා ශික්ෂා පද අතුරෙන් අගයන්න.

(ලකුණු 5+7=12)

8\. i. අරූපාවචර ධ්‍යාන සිත් සතර නම් කරන්න.

ii. සතර පරමාර්ථවල සඳහන් චිත්ත පරමාර්ථය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(ලකුණු 4+8=12)

| | |
|---|---|
| සියලු ම හිමිකම් ඇවිරිණි All Rights Reserved | # මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2019<br>## Primary Piriven final Year Test - 2019<br>3 වසර / Grade 3 |

ත්‍රිපිටක ධර්මය
Thripitaka Dhamma

කාලය : පැය තුනයි
Time : Three hours

විභාග අංකය : ..........................................

I කොටසේ ප්‍රශ්න සියල්ලම ද, II හා III කොටස් වලින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වනසේ තවත් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**I කොටස**

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. අප සිදුහත් බෝසතාණන් අභිනිෂ්ක්‍රමණය කළේ,
   (i) පන්තිස්වන වියේ දී ය.
   (ii) එකුන්තිස්වන වියේ දී ය.
   (iii) සොළොස්වන වියේ දී ය.
   (iv) අටළොස් වියේ දී ය.
2. විනයධර භික්ෂුණීන් අතර අගතනතුර ලැබුවේ කවුරුන් ද?
   (i) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය
   (ii) ඛේමා තෙරණිය
   (iii) පටාචාරා තෙරණිය
   (iv) උප්පලවණ්ණා තෙරණිය
3. සප්ත ධාතූන් වහන්සේලා අතරට අයත් නොවන්නේ
   (i) දකුණු අකු ධාතුව
   (ii) වම් අකු ධාතුව
   (iii) ලලාට ධාතුව
   (iv) ජිව්හා ධාතුව
4. තෙවන ධර්ම සංගායනාවෙන් පසු නව රට ධර්මදූත සේවාවට අයත් නොවන දේශයකි.
   (i) තම්බපණ්ණි දේශය
   (ii) අපරන්ත දේශය
   (iii) සීත දේශය
   (iv) වනවාසි දේශය
5. පොළොන්නරුවේ සරස්වතී මණ්ඩපය ඉදි කරවූයේ කවුරුන් ද?
   (i) මහා විජයබාහු රජු
   (ii) දෙවන විජයබාහු රජු
   (iii) මහා පරාක්‍රමබාහු රජු
   (iv) නිස්සංකමල්ල රජු
6. මහරජතුමනි, අප්‍රමාදීව කටයුතු කරනු මැනවි. දන් දෙනු මැනවි. පෙහෙවස් සමාදන් වුව මැනවි. යනුවෙන් සඳහන් වන්නේ
   (i) සමුද්ද වාණිජ ජාතකයේ ය.
   (ii) පොට්ඨපාද ජාතකයේ ය.
   (iii) ක්ෂාන්තිවාදී ජාතකයේ ය.
   (iv) බ්‍රහ්මදත්ත ජාතකයේ ය.
7. භික්ෂු විනයෙහි සඳහන් සේඛියා හැත්තෑපහ කොටස් කීයකට බෙදා ඇත් ද?
   (i) කොටස් හයකට
   (ii) කොටස් අටකට
   (iii) කොටස් පහකට
   (iv) කොටස් හතකට
8. භික්ෂුවට නොගැලපෙන හිඳගැනීමේ ඉරියව් පල්ලත්ථිකා ලෙස සඳහන් වේ. එම පල්ලත්ථිකා ගණනින් කීය ද?
   (i) තුනකි
   (ii) හතරකි
   (iii) පහකි
   (iv) දෙකකි
9. 'පාත්‍රා ගැටියෙන් පහතට සිටින පමණට ආහාර පිළිගන්නෙමියි' යන්න ප්‍රකාශ වනුයේ මින් කවරක ද?
   (i) පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති
   (ii) සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති
   (iii) සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති
   (iv) සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති

10. බුස්ස බුදුරදුන්ගේ පියා සහ මව කවුරුන් ද?

(i) පියසේන සහ සිරිමා
(ii) ජයසේන සහ සුමනා
(iii) පියසේන සහ සුමනා
(iv) ජයසේන සහ සිරිමා

11. ප්‍රේතලෝකයේ ජීවත්වන මුළු සිරුර ම ගින්නෙන් දැවෙමින් සිටින ප්‍රේත වර්ගය හඳුන්වන්නේ

(i) වන්තාස නමිනි.
(ii) ඛුප්පිපාසික නමිනි.
(iii) පරදත්තූපජීවී නමිනි.
(iv) නරකය නමිනි

12. සප්පුරිස දාන සූත්‍රයේ සඳහන් පරිදි සප්පුරිස දානයට අයත් නොවන්නේ,

(i) භක්තියෙන් දන් දෙයි.
(ii) සුදුසු කාලයේ දන් දෙයි.
(iii) තමන් හා අනුන් නොගටා දන්දෙයි.
(iv) සකසා දන් දෙයි.

13. අංගුත්තර නිකායේ පංචක නිපාතයේ සඳහන් පරිදි කාලදාන

(i) තුනකි.
(ii) හයකි.
(iii) අටකි.
(iv) පහකි.

14. බහුධාතු සූත්‍රය අයත් වන්නේ

(i) ඛුද්දක නිකායට ය.
(ii) අංගුත්තර නිකායට ය.
(iii) මජ්ඣිම නිකායට ය.
(iv) සංයුත්ත නිකායට ය.

15. සුභාෂිතයක තිබිය යුතු අංගයක් නොවන්නේ,

(i) සත්‍යයක් කියූ යේ වෙයි.
(ii) මෛත්‍රියෙන් කියූවක් වෙයි.
(iii) මටසිලුටුව කියූවක් වෙයි.
(iv) තියුණුව කියූවක් වෙයි.

16. සතර පරමාර්ථ ධර්ම පිළිවෙලින් දක්වා ඇති වර්ණය තෝරන්න.

(i) චෛතසික, රූප, චිත්ත, නිබ්බාන
(ii) රූප, චිත්ත, චෛතසික, නිබ්බාන
(iii) චිත්ත, චෛතසික, රූප, නිබ්බාන
(iv) රූප, චෛතසික, චිත්ත, නිබ්බාන

17. උපේක්ඛා සහගත චක්ඛු විඤ්ඤාන සිත අයත් වන්නේ

(i) අකුසල සිත්වලට ය.
(ii) අහේතුක ය.
(iii) සෝභන සිත්වලට ය.
(iv) කුසල සිත් වලට ය.

18. ධම්මපදය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ධම්මපදය ඛුද්දක නිකායේ පළමුවන ග්‍රන්ථය යි.
(ii) ධම්මපදය ගාථා හාරසිය හැටකින් යුක්ත ය.
(iii) ධම්මපදයේ සිව්වන වග්ගය පුප්ඵ වග්ගය යි.
(iv) ධම්මපදයේ වග්ග විසි අටක් ඇත.

19. දිසෝ දිසං යං තං කයිරා යන ගාථාව දේශනා කළේ කාටද ?

(i) චුන්දසූකර ට
(ii) මාතික මාතාවට
(iii) නන්ද ගෝපාලට
(iv) අනේපිඬු සිටුතුමාට

20. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි රචනා කළ ග්‍රන්ථයකි,

(i) පරවි සංදේශය
(ii) සැළලිහිණි සංදේශය
(iii) ගිරා සන්දේශය
(iv) හංස සන්දේශය

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01.

I. බුදුරජාණන් වහන්සේගේ අන්තිම බුද්ධ වචනය ලියා දක්වන්න.

II. ආනන්තරීය පාපකර්ම කළ දෙදෙනකු නම් කොට ඔවුන් කළ එම පාපකර්ම විස්තර කරන්න.

(ලකුණු 6 + 6 = 12)

02.

I. i. ඵෙණූපමං කායමිමං විදිත්වා .............

ii. දූරංගමං ඒකචරං ...............

iii. න පුප්ඵ ගන්ධො පටිවාතමෙති .............

iv. කුම්භූපමං කායමිමං විදිත්වා .......... යන ගාථාවලින් දෙකක් සම්පූර්ණ කරන්න.

II. ඔබ ලියූ එක් ගාථාවක නිදාන කතාව ලියන්න.

(ලකුණු 8+4=12)

03.

I. සක්මන් කිරීමෙන් ලැබෙන ආනිසංස පහ ලියා ඉන් එකක් හඳුන්වන්න.

II. නිරෝගී ජීවිතයක් ගත කිරීම සඳහා බුදු දහමේ ඉගැන්වීම් යොදා ගත හැකි ආකාරය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 5+7=12)

04.

I. **න හි සො උපක්කමො අත්ථි** යන ගාථාව සම්පූර්ණ කරන්න.

II. පෙළ පොතෙහි ඇති ධර්ම කරුණු ඇතුළත් කරමින් කෙටි අනිත්‍ය ප්‍රතිසංයුක්ත ධර්ම දේශනාවක් සකස් කරන්න.

(ලකුණු 4+8=12)

## III කොටස

05.

I. බ්‍රාහ්මණ වර්ණ ධර්මයන්ට අනුව වෛශ්‍යයන්ට අයත් ස්වධර්ම සියල්ල නම් කරන්න.

II. බ්‍රාහ්මණ ඉගැන්වීමෙහි දක්වෙන ආශ්‍රම ධර්ම පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 5+7=12)

06.

I. **ඉදං ඛො පන භික්ඛවේ දුක්ඛ සමුදයං අරියසච්චං** යන මේ පාඨය සම්පූර්ණ කරන්න.

II. දුක්ඛ සමුදය ආර්ය සත්‍ය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 5+7=12)

07.

I. නිවන් මග අවුරන පංචනීවරණ ධර්ම නම් කර ඉන් එකක් හඳුන්වන්න.

II. පිළිකුල් භාවනාව වඩන අයුරු විස්තර කරන්න.

(ලකුණු 5+7=15)

08.

I. අභිධර්මයේ සතර පරමාර්ථ ධර්ම කෙටියෙන් විස්තර කරන්න.

II. ලෝභ මූලික සිත් අට පිළිවෙලින් ලියන්න.

(ලකුණු 5+7=12)

****

| | |
|---|---|
| (සියලු ම හිමිකම් ඇවිරිණි)<br>(All Rights Reserved) | **මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2020**<br>Primary Piriven Year End Test - 2020<br>3 ශ්‍රේණිය / Grade 3 |

**ත්‍රිපිටක ධර්මය** කාලය : පැය තුනයි

**Thipitaka Dhamma** විභාග අංකය :- ................ Time : Three hours

i කොටසේ ප්‍රශ්න සියල්ල ම ද ii කොටසින් ප්‍රශ්න 05 ක් ද තෝරා ගෙන පිළිතුරු ලියන්න.

i කොටස

1. 01. බුදුරජාණන් වහන්සේ ප්‍රථම විනය ශික්ෂාව පනවනු ලැබුවේ බුද්ධත්වයෙන් කීවෙනි වසරෙහි ද?
   i. දොළොස් වන වසරෙහි දී ය. ii. විසිඑක් වන වසරෙහි දී ය.
   iii. නව වන වසරෙහි දී ය. iv. පළමු වන වසරෙහි දී ය.

02. බුදුරජාණන් වහන්සේ විසින් වදාළ ''**සබ්බ පාපස්ස අකරණං**'' යන ගාථා පෙළ අයත් වන්නේ,
   i. ඕවාද ප්‍රාතිමෝක්ෂයට ය. ii. ආඥා ප්‍රාතිමෝක්ෂයට ය.
   iii. භික්ෂු ප්‍රාතිමෝක්ෂයට ය. iv. භික්ෂුණී ප්‍රාතිමෝක්ෂයට ය.

03. **''මම දැන් ශාසනයේ උරුම කරුවෙකු වී ද?''** මෙම පැනය කවුරුන් විසින් කාගෙන් විමසන ලද්දක් ද?
   i. අශෝක රජු විසින් මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන්වහනසේ ගෙනි.
   ii. කොසොල් රජු විසින් බුදුරජාණන් වහන්සේගෙනි.
   iii. බිම්බිසාර මහ රජු විසින් බුදුරජාණන් වහන්සේගෙනි.
   iv. අජාසත්ත රජු විසින් දේවදත්ත හිමියන්ගෙනි.

04. තොටගමුවේ ශ්‍රී රාහුල හිමිපාණන් වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථ පමණක් ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,
   i. කාව්‍යශේඛරය, කව්සිළුමිණ, පංචිකාප්‍රදීපය, සැළලිහිණි සංදේශය.
   ii. යෝගරත්නාකරය, ගුත්තිල කාව්‍යය, වුත්තමාලාව, සැළලිහිණි සංදේශය.
   iii. කාව්‍යශේඛරය, යෝගරත්නාකරය, පරවි සංදේශය, සැළලිහිණි සංදේශය.
   iv. කව්සිළුමිණ, යෝගරත්නාකරය, ගිරා සංදේශය, සැළලිහිණි සංදේශය.

05. මහා පරාක්‍රමබාහු රජතුමාගේ ශාසනික සේවාවක් ලෙස සැලකිය නොහැක්කේ,
   i. තුන් නිකායයන් සමගි කරවීම ය. ii. උත්තරාරාම විහාර සංකීර්ණය ඉදිකිරීම ය.
   iii. සරස්වතී මණ්ඩපය ඉදිකිරීම ය. iv. ආළාහණ පිරිවෙණ කරවීම ය.

06. ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන්හි එන සේඛියා අයත් වන්නේ විනය පිටකයෙහි,
   i. පාරාජික පාලියට ය. ii. පාචිත්තිය පාලියට ය.
   iii. මහාවග්ග පාලියට ය . iv. චුල්ලවග්ග පාලියට ය.

07. සේඛියා ධර්මයන්හි එන ඛම්භකත වග්ගයෙහි **''ඛම්භකත''** යන්නෙහි අර්ථය වන්නේ,
   i. උක්කුටිකයෙන් සිටීම යි. ii. ඉණෙහි දැත් තබා ගෙන සිටීම යි.
   iii. දණහිස් දැතින් බැඳගෙන සිටීම යි. iv. දණහිස් පටලවා ඔසවා ගෙන සිටීම යි.


www.pirivena.lk

08. බිම්බිසාර රජු සිහිනෙන් දුටු ප්‍රේත පිරිස **ඔහුගේ ම ඥාතීන් ලෙස** සිට ඇත්තේ,

i. ඵුස්ස බුදුරජුන්ගේ දවස ය. ii. විපස්සි බුදුරජුන්ගේ දවස ය.
iii. කස්සප බුදුරජුන්ගේ දවස ය. iv. සිඛී බුදුරජුන්ගේ දවස ය.

09. ප්‍රේත ලෝකයේ ප්‍රේතයන් යැපෙන ක්‍රම දෙකක් ඇති බව දැක්වෙන සූත්‍රයක් වන්නේ,

i. තිරෝකුඩ්ඩ සූත්‍රය යි. ii. සප්පුරිසදාන සූත්‍රය යි.
iii. ආදිත්ත පරියාය සූත්‍රය යි. iv. බහුධීතු සූත්‍රය යි.

10. **''සද්ධාය දානං දෙති සක්කච්චං දානං දෙති''** වශයෙන් දාන පහක් පිළිබඳ කරුණු දැක්වෙන්නේ,

i. තිරෝකුඩ්ඩ සූත්‍රයේ ය. ii. දක්ඛිණා විභංග සූත්‍රයේ ය.
iii. සප්පුරිසදාන සූත්‍රයේ ය. iv. පත්තකම්ම සූත්‍රයේ ය.

11. අභිධර්ම පිටකයට අයත් ප්‍රකරණ ග්‍රන්ථයක් ලෙස සැලකිය නොහැක්කේ,

i. නෙත්තිප්පකරණය යි. ii. යමකප්පකරණය යි.
iii. පට්ඨානප්පකරණය යි. iv. පුග්ගලපඤ්ඤත්තිප්පකරණය යි.

12. අභිධර්මයේ චිත්ත කාණ්ඩයෙහි කියවෙන කුසල් හෝ අකුසල් නොවන **හුදෙක් සිතෙහි ප්‍රසන්න භාවය මත** පහළ වන සිත

i. මනෝද්වාරාවජ්ජන නම් වේ. ii. පඤ්චද්වාරාවජ්ජන නම් වේ.
iii. උපේක්ඛා සහගත සන්තීරණ නම් වේ. iv. හසිතුප්පාද නම් වේ.

13. සූත්‍ර පිටකයෙහි ඛුද්දක නිකායට අයත් ධම්මපදය සම්බන්ධව **නිවැරදි ප්‍රකාශය** වන්නේ,

i. ධම්මපදය අයත් වන්නේ උදාන පාලියට ය.
ii. බුදුදහමේ මූලික ඉගැන්වීම් රාශියක් ධම්මපදය තුළ සැකෙවින් දක්වා ඇත.
iii. ධම්මපදයෙහි වග්ග 24කට අයත් ගාථා ඇතුළත් ව ඇත.
iv. චිත්ත වග්ගය යනු ධම්මපදයෙහි දෙවැනි වග්ගය යි.

14. බුදුරජාණන් වහන්සේ ''**අචිරං වතයං කායෝ** '' යන ගාථාව දේශනා කරනු ලැබුවේ,

i. පූතිගත්තතිස්ස හිමියන්ට ය. ii. මේඝිය හිමියන්ට ය.
iii. භාගිනෙය්‍ය සංඝරක්ඛිත හිමියන්ට ය. iv. සෝරෙය්‍ය හිමියන්ට ය.

15. **මනාව සෙවිලි නොකළ පියස්සෙන් ගෙය තෙමෙන්නා සේ අභාවිත වූ සිත රාගාදි ක්ලේෂයන්ගෙන් තෙමෙන බව** දැක්වෙන ගාථාවෙහි මුල් පදය වන්නේ,

i. සුකරානි අසාධූනි... ii. යථා අගාරං දුච්ඡන්නං...
iii. යථා සඞ්කාර ධානස්මිං .... iv. අනවට්ඨිත චිත්තස්ස...

16. සිතෙහි හා කයෙහි ඇති වන මැළි බව,

i. කාමච්ඡන්දය නම් වේ. ii. උද්ධච්ච කුක්කුච්ඡ නම් වේ.
iii. ථීනමිද්ධ නම් වේ. iv. විචිකිච්ඡා නම් වේ.

www.pirivena.lk

17. බ්‍රාහ්මණ ධර්මවලට අදාළ නිවැරදි වරණය වන්නේ,

i. ඉගෙනීම, ප්‍රජා රක්‍ෂණය, යාග කරවීම, දන් දීම බ්‍රාහ්මණ ස්වධර්ම වේ.
ii. බ්‍රහ්මචාරි ජීවිතයක් ගත කිරීම බ්‍රාහ්මණ ධර්මයන්ගේ එක් අවධියක් වේ.
iii. වෛශ්‍ය යනු රටෙහි පාලන තන්ත්‍රය සම්බන්ධ ව වගකීම් පැවරුණ පිරිස වේ.
iv. ශුද්‍රයන්ට දන් දීම සඳහා පමණක් අවසරය ලබා දී තිබුණි.

18. සාමණේර පැවිද්ද ආරම්භ වූයේ,

i. සුනීත පැවිදි කිරීමත් සමග ය.
ii. සෝපාක පැවිදි කිරීමත් සමග ය.
iii. රාහුල කුමරු පැවිදි කිරීමත් සමග ය. .
iv. යස කුමරු පැවිදි කිරීමත් සමග ය.

19. **ඤත්ති චතුත්ථකම්ම** උපසම්පදාව පළමුවරට අනුදැන වදාළේ,

i. රාධ බමුණාට ය.
ii. තුන් බෑ ජටිලයන්ට ය.
iii. රාහුල කුමරුවන්ට ය.
iv. අනුරුද්ධ, භගු ආදීන්ට ය.

20. වේළුවනාරාමය බුදුරජාණන් වහන්සේට පූජා කළේ,

i. බිම්බිසාර මහ රජතුමා ය.
ii. විශාඛා මහ උපාසිකාව ය.
iii. කොසොල් මහ රජතුමා ය.
iv. අනේපිඬු මහ සිටුතුමා ය.

(ලකුණු 02x20=40 යි)

## II - කොටස

2.

i. බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලත් පුද්ගලයන් පස් දෙනෙක් නම් කරන්න.
ii. ඉන් එක් පුද්ගලයෙක් පිළිබඳ ව විස්තර කරන්න. (ලකුණු 05+07=12 යි)

3.

i. දුටුගැමුණු රජතුමා විසින් සිදු කරන ලද ශාසනික සේවාවන් පහක් ලියන්න.
ii. මහා පරාක්‍රමබාහු රජතුමා ශාසනයට කළ සේවාව පිළිබඳ ව විස්තර කරන්න.

(ලකුණු 05+07=12 යි)

4.

i. **''සමණා මයං මහාරාජ''** යන ගාථාව සම්පූර්ණ කර එහි තේරුම ලියන්න.
ii. මහින්දාගමනයෙන් අප රටට උරුම වූ දායාද පිළිබඳ ව විස්තර කරන්න.

(ලකුණු 05+07=12 යි)

5.

i. භික්ෂූන් වහන්සේ නමක් ගමෙහි හැසිරෙන විට නොකළ යුතු අශෝභන චර්යා පහක් ලියන්න.
ii. සේඛියා ශික්ෂා අනුගමනය කිරීමෙන් භික්ෂූන්වහන්සේ නමකගේ සංවරය ඇති වන ආකාරය පහදන්න.

(ලකුණු 05+07=12 යි)



www.pirivena.lk

6.

i. සප්පුරිසදාන සූත්‍රයට අනුව සප්පුරිස දාන පහකි. ඒවා ලියා දක්වන්න.

ii. දන් දීමේදී පින වැඩිවන්නේ, කෙසේ දන් දීමෙන් දැයි සප්පුරිසදාන සූත්‍රය ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 05+07=12 යි)

7.

i. බහු ධීතු සූත්‍රයේ දී හමු වන භාරද්වාජගොත්ත බමුණාට සිය ජීවිතයේ විදීමට සිදු වූ දුක් කරදර පහක් ලියන්න.

ii. ''ගිහි දිවියට වඩා පැවිදි දිවිය ඉතා සැහැල්ලු ය.'' යන්න විස්තර කරන්න.

(ලකුණු 05+07=12 යි)

8. පහත සඳහන් ගාථා අතුරින් දෙකක් සම්පූර්ණ කර තේරුම ලියන්න.

i. ඵෙණූපමං කායමිමං විදිත්වා ....

ii. යථාපි භමරො පුප්ඵං ....

iii. න පරෙසං විලොමානි ....

iv. යථාපි පුප්ඵරාසිම්හා ....

(ලකුණු 6×2=12 යි)

9.

i. අභිධර්මයෙහි එන සතර පරමාර්ථ ධර්ම නම් කරන්න.

ii. ලෝභමූල සිත් **අට** ලියා දක්වන්න.

(ලකුණු 04+08=12 යි)

*****



www.pirivena.lk

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜுரிமையுஜுடையது]
All rights reserved]

දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
அறநெறிப் பள்ளிகள், பிரிவேனாக்கள் மற்றும் பிக்கு கல்வி மாநில அமைச்சகம் - *பிரிவேனா கல்விக் கிளை*
State Ministry of Dhamma Schools, Pirivenas and Bhikku Education – Piriven Educational Branch

**වර්ෂාවසාන පරීක්ෂණය - 2021 (2022)**
**ஆண்டிறுதிப் பரீட்சை - 2021 (2022)**
Year End Term Test – 2021 (2022)

පැ තුනයි

**ත්‍රිපිටක ධර්මය** **විභාග අංකය ..............................** **3 ශ්‍රේණිය**

සැලකිය යුතුයි :
❖ **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසින් ප්‍රශ්න පහක් ද තෝරාගෙන පිළිතුරු සපයන්න.**

## I කොටස

01. **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. බුදුරජාණන් වහන්සේ විසිවන වස් කාලය ගත කළේ කිනම් ආරාමයක ද ?
   i. පූර්වාරාමයේ ii. ජේතවනාරාමයේ
   iii. වෙළුවනාරාමයේ iv. ඝෝෂිතාරාමයේ

2. සැවැත්නුවර මිගාර සිටුතුමාගේ පුත් පූර්ණවර්ධන සිටු පුත්‍රයා භද්දිය නුවරින් සරණ පාවා ගත් කුල කුමරිය,
   i. සුමනා සිටු දියණිය යි. ii. මහා සුභද්‍රා සිටු දියණිය යි.
   iii. විශාඛා සිටු දියණිය යි. iv. චූල සුභද්‍රා සිටු දියණිය යි.

3. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට බුදුදහම රැගෙන වැඩම කරන ලද්දේ,
   i. බුද්ධ වර්ෂ 235 දී ය. ii. බුද්ධ වර්ෂ 228 දී ය.
   iii. බුද්ධ වර්ෂ 237 දී ය. iv. බුද්ධ වර්ෂ 236 දී ය.

4. තෙවන ධර්ම සංගායනාවෙන් පසු සිදුකළ රටවල් නවයක ධර්මදූත සේවයට අයත් **නොවන්නේ,**
   i. සිත දේශය යි. ii. අපරන්ත දේශය යි.
   iii. තම්බපණ්ණි දේශය යි. iv. වනවාසී දේශය යි.

5. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ මව ලෙස හැඳින්වෙන්නේ,
   i. අනුලා දේවිය ය. ii. හංසවතී දේවිය ය.
   iii. ස්වර්ණවතී දේවිය ය. iv. කමලාවතී දේවිය ය.

6. බුදුරජාණන් වහන්සේ විසින් **සමුද්‍ර වාණිජ ජාතකය** දේශනා කරන ලද්දේ,
   i. දේවදත්ත භික්ෂුවට ය. ii. කෝකාලික භික්ෂුවට ය.
   iii. උදායි භික්ෂුවට ය. iv. ඡබ්බග්ගිය භික්ෂූන්ට ය.

7. ප්‍රාතිමෝක්ෂ ශික්ෂාවන්හි එන සේඛියා අයත් වන්නේ විනය පිටකයෙහි,
   i. පාරාජික පාළියට ය. ii. මහා වග්ග පාළියට ය.
   iii. පාචිත්තිය පාළියට ය. iv. චුල්ලවග්ග පාළියට ය.

8. බිම්බිසාර රජු සිහිනෙන් දුටු ප්‍රේත පිරිස ඔහුගේ ඥාතීන් ලෙස සිට ඇත්තේ,
   i. ඵුස්ස බුදුරජාණන් වහන්සේගේ කාලයේ ය.
   ii. කස්සප බුදුරජාණන් වහන්සේගේ කාලයේ ය.
   iii. විපස්සි බුදුරජාණන් වහන්සේගේ කාලයේ ය.
   iv. සිඛි බුදුරජාණන් වහන්සේගේ කාලයේ ය.

9. ප්‍රේත ලෝකයේ ජීවත් වන ප්‍රේතයන් අතරින් සිරුර ගින්නෙන් දැවෙමින් සිටින ප්‍රේත වර්ගය හඳුන්වන්නේ,
   i. නිජ්ඣාම තණ්හික නමිනි.
   ii. ඛුප්පිපාසික නමිනි.
   iii. පරදත්තපජීවි නමිනි.
   iv. වන්තාස නමිනි.

10. අකුසල් සිත්හි යෙදෙන **"උද්ධච්ච"** යන්නෙහි අදහස වන්නේ,
   i. උඩඟු කමයි. ii. සැකය යි. iii. නොසන්සුන් කැළඹුණු ගතිය යි. iv. අලසකම යි.

11. ධම්මපදයේ චිත්ත වග්ගයට අයත් ගාථා ප්‍රමාණය,
   i. 11 කි. ii. 12 කි. iii. 13 කි. iv. 15 කි.

12. ලංකා ඉතිහාසයේ අමරණීය සේවාවක් කළ දුටුගැමුණු රජු සිදු කළ අසහාය නිර්මාණයක් වන්නේ,
   i. අභයගිරිය යි.
   ii. ජේතවනය යි.
   iii. ලෝවාමහාපාය යි.
   iv. ථූපාරාමය යි.

13. මහා පරාක්‍රම රජු දවස භික්ෂු සමාජය පරිහානිකර තත්වයෙන් මුදවා ගැනීමට ධර්මාධිකරණ මණ්ඩලයක් පත් කරන ලදි. එහි මුලසුන දරන ලද්දේ,
   i. කාශ්‍යප හිමියන් ය.
   ii. ශාරිපුත්‍ර හිමියන් ය.
   iii. ධර්මාරාම හිමියන් ය.
   iv. වාචිස්සර හිමියන් ය.

14. ප්‍රජා රක්ෂණය, යාග කරවීම, දන්දීම ආදිය ස්වධර්මයක් ලෙස හිමිවූයේ,
   i. බ්‍රාහ්මණයන්ට ය. ii. වෛශ්‍යයන්ට ය. iii. ශුද්‍රයන්ට ය. iv. ක්ෂත්‍රියයන්ට ය.

15. බුදුරජාණන් වහන්සේ විසින් පස්වග තවුසන්ගේ රහත්ඵල අවබෝධය සඳහා දේශිත සූත්‍රය කුමක් ද?
   i. අග්ගික්ඛන්ධෝපම සූත්‍රය යි.
   ii. අනත්තලක්ඛණ සූත්‍රය යි.
   iii. ජනවසභ සූත්‍රය යි.
   iv. මහා නිදාන සූත්‍රය යි.

16. ආසවට්ඨානීය ධර්මවලට අයත් නොවන්නකි,
   i. සසුනේ පැවිදිව බොහෝ කල් ගෙවූ භික්ෂූන් බහුල වීම
   ii. සසුනෙහි භික්ෂු පිරිස බහුල වීම
   iii. සසුනෙහි විනය විරෝධී කටයුතු සිදු කිරීම
   iv. භික්ෂූවට ලැබෙන ලාභ සත්කාර බහුල වීම

17. භාවනාවේ දී "ආන" යන්නෙහි අර්ථය වන්නේ,
   i. මුඛයෙන් පිටකරන වාතය යි.
   ii. නාසයෙන් පිට කරන වාතය යි.
   iii. දෙකනින් පිට කරන වාතය යි.
   iv. ශරීරය තුළට ඇදගන්නා වාතය යි.

18. බුදු පසේබුදු මහරහතන් වහන්සේලාට රාගයෙන් තොරව සිනහ පහළ වෙයි. එම සිත හඳුන්වන්නේ,
   i. පඤ්චද්වාරාවජ්ජන සිත යි.
   ii. උපේක්ඛා සහගත සන්තීරණ සිත යි.
   iii. මනොද්වාරාවජ්ජන සිත යි.
   iv. හසිතුප්පාද සිත යි.

19. අංගුත්තර නිකායට අයත් **සත්පුරුෂ සූත්‍රයේ** සඳහන් පරිදි කාලදාන ගණන,
   i. දහයකි. ii. හයකි. iii. පහකි. iv. හතරකි.

20. බ්‍රාහ්මණ ඉගැන්වීම් වල සඳහන් ආශ්‍රම ධර්මයන්ට අයත් නොවන්නකි,
   i. බ්‍රහ්මචාරී ii. සන්‍යාසි iii. පාංශු රක්ෂණය iv. ගෘහස්ථ

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

02. I. බුදුරජාණන් වහන්සේගේ අන්තිම බුද්ධ වචනය ලියා එහි අර්ථය දක්වන්න.

II. බුදුරජාණන් වහන්සේගේ ආදාහන පූජාව හා ධාතූන් වහන්සේලා බෙදා දීම පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 4 + 8 = 12)

03. I. සේඛියා පැනවීමට හේතු කෙටියෙන් පහදන්න.

II. උජ්ඣග්ගික වග්ගයේ සේඛියාවන්ට අනුව භික්ෂු චර්යාව කෙසේ සකස් විය යුතුදැයි දක්වන්න.

(ලකුණු 5 + 7 = 12)

04. I. අකුසල සිත් විග්‍රහ කර දක්වන, **"අට්ඨධා ලොභ මූලානි"** යන ගාථාව ලියන්න.

II. ලෝභ මූලික සිත් ලියා දක්වන්න.

(ලකුණු 4 + 8 = 12)

05. I. **"සමණා මයං මහාරාජ...."** යන ගාථාව සම්පූර්ණ කර, අර්ථය ලියන්න.

II. මිහිඳු මහරහතන් වන්සේ ලක්වැසියන්ට සිදු කළ උතුම් මෙහෙවර උදාහරණ තුනක් ඇතුළත් වන සේ විස්තර කරන්න.

(ලකුණු 5 + 7 = 12)

06. පහත සඳහන් ගාථාවන්ගෙන් දෙකක් සම්පූර්ණ කර අර්ථය ලියන්න.

I. **සුදුද්දසං සුනිපුණං......**
II. **අනවස්සුත චිත්තස්ස......**
III. **යථාපි රුචිරං පුප්ඵං......**
IV. **අප්පමත්තො අයං ගන්ධො......**

(ලකුණු 6 + 6 = 12)

07. I. බ්‍රහ්මදත්ත ජාතකයේ වර්තමාන කතාව ලියන්න.

II. **"ඉල්ලන්නා පිරිහෙන්නේය"** සමුද්ද වාණිජ ජාතකය ඇසුරින් පහදන්න.

(ලකුණු 5 + 7 = 12)

08. I. **තිරෝකුඩ්ඩ සූත්‍රය**ට අනුව ප්‍රේත ලෝකය පිළිබඳ කෙටියෙන් දක්වන්න.

II. ප්‍රිය වචන කථා කරන භික්ෂුව සියල්ලන්ගේ ම ප්‍රසාදයට ලක් වේ. **සුභාසිත සූත්‍රය** ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 5 + 7 = 12)

**09.** I. බ්‍රාහ්මණ ඉගැන්වීමේ එන චතුර් වර්ණ ධර්ම නම් කරන්න.

II. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව නිර්මාණවාදය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 4 + 8 = 12)

සියලුම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புஜரிமையஜுடையது]
All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය
கல்வி அமைச்சகம் - பிரிவேனா கல்விக் பிரிவு
Ministry of Education - Division of Piriven Education

වර්ෂාවසාන වාර පරීක්ෂණය - 2022 (2023)
ஆண்டிறுதிப் பரீட்சை - 2022 (2023)
Year End Term Test – 2022 (2023)

පැය දෙකයි

**ත්‍රිපිටක ධර්මය** විභාග අංකය : ........................................... **3 ශ්‍රේණිය**

❖ I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසින් තෝරාගත් ප්‍රශ්න පහකට ද පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. බුදුරජාණන් වහන්සේ සූවිසි වසක් සැවැත්නුවර වැඩ විසූහ. ඉන් සය වසක් වැඩ සිටියේ,
   (1) පූර්වාරාමයේ ය. (2) වේළුවනාරාමයේ ය.
   (3) ඉසිපතනාරාමයේ ය. (4) ජේතවනාරාමයේ ය.

2. පැවිදි වීමෙන් පසුව දරු ගැබක් ඇති වූවා යැ යි චෝදනාවට ලක් වූයේ,
   (1) පටාචාරා භික්ෂුණිය යි. (2) කුණ්ඩලකේශී භික්ෂුණිය යි.
   (3) කුමාර කාශ්‍යප භික්ෂුණිය යි. (4) කිසාගෝතමී භික්ෂුණිය යි.

3. සමඵල සම ආනිසංස ලැබෙන දාන දෙකක් පිළිබඳව බුදුරජාණන් වහන්සේ දේශනා කළහ. එම දාන පූජා කරන ලද්දේ,
   (1) තපස්සු හා භල්ලුක වෙළඳ දෙබෑයන් විසිනි.
   (2) සුජාතා සිටු දියණිය හා චුන්ද කම්මාර පුත්‍රයා විසිනි.
   (3) කොසොල් රජු හා බිම්බිසාර රජු විසිනි.
   (4) අනේපිඬු සිටුතුමා හා සුජාතා සිටු දියණිය විසිනි.

4. බුදුරජාණන් වහන්සේ පාවා නුවර සිට කුසිනාරා නුවරට වඩින අතර මග පැන් වැළඳුවේ,
   (1) කුකුත්ථා නදියෙන් ය. (2) නේරංජා නදියෙන් ය.
   (3) අචිරවතී නදියෙන් ය. (4) රෝහිණී නදියෙන් ය.

5. ජේතවනාරාමය කේන්ද්‍ර කරගෙන, ලක්දිව දළදා මාළිගය, පිළිම ගෙවල්, ධර්මශාලා, දාන ශාලා, ගිනිහල් ගෙවල්, සක්මන් මළු ද ඇතුළුව දෙසිය පනහක් පමණ වූ ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කරවූයේ,
   (1) මහා විජයබාහු රජතුමා ය. (2) මහා පරාක්‍රමබාහු රජතුමා ය.
   (3) දුටුගැමුණු රජතුමා ය. (4) කිත්සිරිමෙවන් රජතුමා ය.

6. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කළ ග්‍රන්ථයක් ඇතුළත් වරණය වන්නේ,
(1) කාව්‍යශේඛරය (2) මයුර සංදේශය (3) ගිරා සංදේශය (4) කව්සිළුමිණ

7. බෝධිසත්වයන් වහන්සේගේ ඉවසීමේ උදාර ගුණය ප්‍රකට වන ජාතකය වන්නේ,
(1) සමුද්දවාණිජ ජාතකය (2) බ්‍රහ්මදත්ත ජාතකය
(3) සීලවිමංස ජාතකය (4) ක්ෂාන්තිවාදී ජාතකය

8. ධර්ම ශ්‍රවණයේ දී ශ්‍රාවකයා විසින් ශාස්තෘවරයාට, ධර්මයට හා ධර්ම දේශකයාට ගරු සරු නො කිරීම් ආදිය විස්තර කරන්නේ,
(1) පාදුකා වර්ගයේ දී ය. (2) ඛම්හකත වර්ගයේ දී ය.
(3) සුරුසුරු වර්ගයේ දී ය. (4) උජ්ජග්ගික වර්ගයේ දී ය.

9. අංගුත්තර නිකායේ සඳහන් වන පරිදි **"කාල දාන"** ගණනින්
(1) හතරකි. (2) පහකි. (3) හයකි. (4) හතකි.

10. "විතක්ක, විචාර, පීති, සුඛ, ඒකග්ගතා සහිත ................................ කුසල විපාක චිත්තං." හිස්තැනට සුදුසු වරණය තෝරන්න.
(1) තතියජ්ඣාන (2) දුතියජ්ඣාන (3) පඨමජ්ඣාන (4) චතුත්ථජ්ඣාන

11. පඤ්ච ඉන්ද්‍රියයන් පිළිවෙළින් ඇති වරණය වන්නේ,
(1) සද්ධා, විරිය, සමාධි, සති, පඤ්ඤා (2) සද්ධා, විරිය, සති, සමාධි, පඤ්ඤා
(3) සද්ධා, සති, විරිය, සමාධි, පඤ්ඤා (4) සද්ධා, විරිය, සති, පඤ්ඤා, සමාධි

12. **මස්, නහර, ඇට, ඇට මිදුළු, වකුගඩු** යන ඉඳුරන් පහ ඇතුළත් වර්ගය හඳුන්වනු ලබන්නේ,
(1) තච පඤ්චකය නමින් ය. (2) මත්ථලුංග පඤ්චකය නමින් ය.
(3) පප්ඵාස පඤ්චකය නමින් ය. (4) වක්ක පඤ්චකය නමින් ය.

13. **"දුක්ඛාර්ය සත්‍යය සෑම අතකින් ම විමසා පිරිසිඳ දත යුතු ය"** යන අර්ථය දැක්වෙන්නේ,
(1) පරිඤ්ඤෙය්‍යා යනුවෙනි. (2) භාවේතබ්බං යනුවෙනි.
(3) පහාතබ්බං යනුවෙනි. (4) සච්ඡිකාතබ්බං යනුවෙනි.

14. **"අථ වා පන පේතානං කාලකතානං දක්ඛිණං අනුපදස්සාමි"** යන පාඨය ඇතුළත් වන්නේ,
(1) දාන විපත්ති සූත්‍රයේ ය. (2) තිරෝකුඩ්ඩ සූත්‍රයේ ය.
(3) සිගාල සූත්‍රයේ ය. (4) නිධිකණ්ඩ සූත්‍රයේ ය.

15. අසදෘශ මහා දානය පූජා කළේ,
(1) බිම්බිසාර මහ රජු ය. (2) කොසොල් මහ රජු ය.
(3) අනේපිඬු සිටාණන් ය. (4) ධනංජය සිටාණන් ය.

16. නැලි දහසයක බත් අනුභව කළ ....................... රජතුමා, බුදුරජාණන් වහන්සේගේ අවවාද පිළිගෙන ආහාර පාලනය කර නිරෝගී ජීවිතයක් ගත කළේය.

(1) බිම්බිසාර (2) කොසොල් (3) අජාසත්ත (4) පුක්කුසාති

17. ධම්මපදයේ චිත්ත වග්ගයට අයත් ගාථා හා නිදාන කථා ගණන, නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

(1) ගාථා එකොළහක් සහ නිදාන කථා නවයකි.
(2) ගාථා දහසයක් සහ නිදාන කථා දොළහකි.
(3) ගාථා දහහතරක් සහ නිදාන කථා එකොළහකි.
(4) ගාථා එකොළහක් සහ නිදාන කථා දහයකි.

18. තුන්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ධර්ම ප්‍රචාරය සඳහා මහිස මණ්ඩලයට වැඩම කළේ,

(1) රක්ඛිත තෙරුන් ය. (2) මහින්ද තෙරුන් ය.
(3) මජ්ඣිම තෙරුන් ය. (4) මහා දේව තෙරුන් ය.

19. බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව ක්ෂත්‍රියයන්ට අයත් ස්වධර්මයකි,

(1) දන් පිළිගැනීම (2) ඉගැන්වීම (3) දන් දීම (4) පශු රක්ෂණය

20. ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථයක් වන්නේ,

(1) විමානවත්ථු (2) අබ්භූතධම්ම (3) වේදල්ල (4) මහාවග්ගපාළි

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

01. (i) බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූවන් සතර දෙනෙකු නම් කරන්න.

(ii) ඉහත (i) හි ඔබ සඳහන් කළ දෙදෙනෙකු පිළිබඳ විවරණ සපයන්න.

(ලකුණු 4 + 8 = 12)

02. (i) පහත සඳහන් ගාථා අතරින් දෙකක් සම්පූර්ණ කරන්න.

ඵන්දනං චපලං චිත්තං .......
පුප්ඵානි හේව පචිනන්තං ...........
යථාපි භමරො පුප්ඵං ...........
න තං මාතා පිතා කයිරා .............

(ii) ඉන් එක් ගාථාවක නිදාන කථාව ලියන්න.

(ලකුණු 4 + 8 = 12)

03. (i) **සුභාෂිත වාචා** සූත්‍රයට අනුව යහපත් වචනයක තිබිය යුතු අංග **හතරක්** නම් කරන්න.

(ii) සත් පුරුෂයෙකු විසින් දෙන දානයක තිබිය යුතු ලක්ෂණ **"සප්පුරිස දාන"** සූත්‍රය ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 4 + 8 = 12)

04. (i) **"යෝ වෙ හත්ථෙ ච පාදේ ච"** ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) "ඉවසීම නොමැතිකම සමාජ ගැටලු වර්ධනයට හේතු වේ." ක්ෂාන්තිවාදී ජාතකය ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 4 + 8 = 12)

05. (i) ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිවෙළින් ලියන්න.

(ii) දුක්ඛ ආර්ය සත්‍යය විස්තර කරන්න.

(ලකුණු 4 + 8 = 12)

06. (i) පාදුකා වර්ගයට අයත් ධර්ම දේශනා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු සේඛියා පහක් ලියන්න.

(ii) දහම් දෙසීමේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත්, සේඛියා ඇසුරු කරමින් විස්තර කරන්න.

(ලකුණු 4 + 8 = 12)

07. (i) අරූපාවචර කුසල සිත් පහ නම් කරන්න.

(ii) ආනාපාන සති භාවනාව වඩන අයුරු පියවර හතරකින් විස්තර කරන්න.

(ලකුණු 4 + 8 = 12)

08. (i) **"සංඝෙ ගොතමී දෙහි. සංඝෙ තෙ <u>දින්නෙ</u> අහමෙව පූජිතො <u>භවිස්සාමි</u>"** යන පාඨයේ අදහස නිවැරදිව ලියන්න.

(ii) **"අනුජානාමි භික්ඛවේ භත්තග්ගෙ අනුමොදිතුං"** යන බුද්ධ වචනය උපයෝගී කරගෙන භුක්තානුමෝදනාවක් පිළියෙල කරන්න.

(ලකුණු 4 + 8 = 12)

[ සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமை உடையது]
[ All rights reserved]

අධ්‍යාපන අමාත්‍යාංශය - පිරිවෙන් අධ්‍යාපන අංශය/Ministry of Education - Division of Piriven Education/கல்வி அமைச்சு - பிரிவெனாக்கள் கல்விப் பிரிவு

| 03 | S | I |
|---|---|---|

# පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2023 (2024)

## 03 ශ්‍රේණිය

පැ තුනයි.

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## (3) ත්‍රිපිටක ධර්මය

**සැලකිය යුතුයි :**

- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 ක් ලැබේ.
- දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.
- I කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, II කොටසින් තෝරාගත් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

- **අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. සම්බුදු සසුනේ ප්‍රථම විනය ශික්ෂා පදය පැනවීම සඳහා හේතු වූ භික්ෂූන් වහන්සේ වූයේ,
   (1) සුදින්න ය. (2) දේවදත්ත ය.
   (3) උපනන්ද ය. (4) සුනීත ය.

2. භාග්‍යවතුන් වහන්සේ **අටළොස් වසක්** සැවැත් නුවර ................................ වැඩ සිටියහ.
   (1) පූර්වාරාමයේ (2) වේළුවනාරාමයේ
   (3) ජේතවනාරාමයේ (4) ඝෝෂිතාරාමයේ

3. **"යො වදතං පවරො මනුජෙසු"** යන ගාථා පෙළ බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළේ,
   (1) පොක්ඛරසාති බමුණාට ය. (2) මට්ටකුණ්ඩලීට ය.
   (3) ඡත්ත මානවකයාට ය. (4) මඝ මානවකයාට ය.

4. තථාගතයන් වහන්සේගේ ආදාහනයෙන් පසු ධාතූන් වහන්සේලා බෙදා දුන් බමුණා වූයේ,
   (1) අපුත්තක ය. (2) ද්‍රෝණ ය.
   (3) කොණ්ඩඤ්ඤ ය. (4) තෝදෙය්‍ය ය.

5. තෙවන ධර්ම සංගායනාවෙන් පසු ලක්දිව ධර්මප්‍රචාරයේ ප්‍රධානත්වය දැරූයේ,
   (1) මිහිඳු මහරහතන් වහන්සේ ය. (2) රේවත මහරහතන් වහන්සේ ය.
   (3) මහා රක්ඛිත මහරහතන් වහන්සේ ය. (4) මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ය.

6. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචනා කළ කෘතියක් නොවන්නේ,
   (1) හංස සන්දේශය යි. (2) පරවි සන්දේශය යි.
   (3) සැළලිහිණි සන්දේශය යි. (4) පංචිකාප්‍රදීපය යි.

7. ලක්දිව සරස්වතී මණ්ඩපය ඉදි කළ රජතුමා වූයේ,
   (1) දුටුගැමුණු රජතුමා ය. (2) මහා පරාක්‍රමබාහු රජතුමා ය.
   (3) කාවන්තිස්ස රජතුමා ය. (4) මුටසීව රජතුමා ය.

8. අංගුත්තර නිකායේ පංචක නිපාතයේ සප්පුරිස දාන සූත්‍රයේ සඳහන් වන දාන ගණන,
   (1) පහකි. (2) පහළොවකි.
   (3) විසි පහකි. (4) පනස් පහකි.

9. තම ජීවිතයේ ඇති දුක් ගැහැට පිළිබඳ භාග්‍යවතුන් වහන්සේ සමඟ ඇති වූ සංවාදයෙන් පසුව **බහුධීතු සූත්‍රය** දේශනා කරන ලද්දේ,
   (1) භාරද්වාජගොත්ත බමුණාට ය. (2) සොත්ථිය බමුණාට ය.
   (3) සෝණදණ්ඩ බමුණාට ය. (4) කූටදන්ත බමුණාට ය.

10. ප්‍රාතිමෝක්ෂයෙහි ශික්ෂාපද වර්ගීකරණයට අනුව, පාදුකා වග්ගයට අයත් සේඛියා ප්‍රමාණය වන්නේ,
   (1) එකොළහකි. (2) දොළහකි. (3) දහ තුනකි. (4) පහළොවකි.

11. **තිරෝකුඩ්ඩ සූත්‍රයේ** විස්තර වන පරිදි **සෙම් සොටු ලෙව කා ජීවත් වන** ප්‍රේත වර්ගය හඳුන්වන්නේ,
   (1) නිජ්ඣාමතණ්හික ලෙස ය. (2) ඛුප්පිපාසික ලෙස ය.
   (3) වන්තාස ලෙස ය. (4) පරදත්තූපජීවී ලෙස ය.

12. අංගුත්තර නිකායේ පංචක නිපාතයේ **සුභාසිත වාචා සූත්‍රයේ** සඳහන් සුභාෂිතයක තිබිය යුතු අංග ගණන,
   (1) පහකි. (2) හයකි. (3) නවයකි. (4) දොළහකි.

13. අභිධර්ම විග්‍රහයට අනුව, ඇසත් රූපයත් මුණ ගැසීම නිසා පහළවන මධ්‍යස්ථ වේදනාවෙන් යුත් සිත වන්නේ,
   (1) උපේක්ඛාසහගත සෝත විඤ්ඤාණ සිත ය. (2) උපේක්ඛාසහගත ඝාන විඤ්ඤාණ සිත ය.
   (3) උපේක්ඛාසහගත චක්ඛු විඤ්ඤාණ සිත ය. (4) උපේක්ඛාසහගත ජිව්හා විඤ්ඤාණ සිත ය.

14. ධම්මපදයේ පුප්ඵ වග්ගයට අයත් ගාථා හා නිදාන කතා ප්‍රමාණය නිවැරදිව ඇතුළත් වරණය වන්නේ,
   (1) ගාථා 16 හා නිදාන කතා 12 කි. (2) ගාථා 15 හා නිදාන කතා 12 කි.
   (3) ගාථා 16 හා නිදාන කතා 10 කි. (4) ගාථා 11 හා නිදාන කතා 09 කි.

15. සංයුක්ත නිකායේ **කුම්මෝපම සූත්‍රයේ** ඉබ්බා උපමා කර ඇත්තේ,
   (1) චිත්තයට ය. (2) වචනයට ය.
   (3) පංචේන්ද්‍රියන්ට ය. (4) ඉහත කිසිවකට නොවේ.

16. පිළිකුල් භාවනාවට කර්මස්ථාන කර ගන්නා කුණප කොටස් සංඛ්‍යාව,
   (1) විසි දෙකකි. (2) තිස් එකකි. (3) තිස් දෙකකි. (4) හතළිස් දෙකකි.

17. තණ්හාව දුකට හේතු වන්නේ කාරණා තුනක් නිසා ය. මෙහි **"පොනොභවිකා"** යන්නෙහි සරල අර්ථය වන්නේ,
   (1) පුනර්භවය ඇති කරන ස්වභාවය යි.
   (2) සිත කාමයෙන් ඇලෙන ස්වභාවය යි.
   (3) රූප ශබ්දා දී අරමුණෙහි සිත ඇලෙන ස්වභාවය යි.
   (4) ඉහත කිසිවක් නොවේ.

18. බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ප්‍රජා රක්ෂණය, දන්දීම, යාග කරවීම, වේද අධ්‍යයනය, කාමයෙහි නො ඇලීම ආදී ස්වධර්ම අයත් වන්නේ,
   (1) ක්ෂත්‍රියයන්ට ය. (2) වෛශ්‍යයන්ට ය.
   (3) ක්ෂුද්‍රයන්ට ය. (4) බ්‍රාහ්මණයන්ට ය.

19. ධර්ම ප්‍රචාරය සඳහා මහාරාෂ්ට්‍ර දේශයට වැඩම කරන ලද්දේ,
   (1) මහා ධම්මරක්ඛිත තෙරුන් වහන්සේ ය. (2) මහා රක්ඛිත තෙරුන් වහන්සේ ය.
   (3) මජ්ඣිම තෙරුන් වහන්සේ ය. (4) මහා මහින්ද තෙරුන් වහන්සේ ය.

20. රුහුණු, පිහිටි, මායා යන ත්‍රිසිංහලය එක්සේසත් කොට, බුදුදහමේ චිරස්ථිතිය පිණිස ක්‍රියා කළ ශ්‍රේෂ්ඨ නරපතියෙකු වූයේ,
   (1) මුටසීව රජතුමා ය. (2) දුටුගැමුණු රජතුමා ය.
   (3) දේවානම්පියතිස්ස රජතුමා ය. (4) නිශ්ශංකමල්ල රජතුමා ය.

**(ලකුණු 2 X 20 = 40)**

## II - කොටස

2. i. බුදුරජාණන් වහන්සේගේ මහා කරුණාවෙන් පිහිට ලැබූවන් **පස් දෙනෙකු** නම් කරන්න.

ii. ඔබ සඳහන් කළ පස් දෙනාගෙන් දෙදෙනෙකු පිළිබඳ විස්තර කරන්න.

**( ලකුණු 5 + 7 = 12 )**

3. i. ඕවාද ප්‍රාතිමෝක්ෂයට අයත් ගාථා තුනෙන් එකක් ලියන්න.

ii. ප්‍රථම විනය ශික්ෂාපදය පැනවීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න.

**( ලකුණු 5 + 7 = 12 )**

4. i. **"පාරගංගං ගමිස්සාමි ජොතෙතුං සාසනං අහං"** මෙහි සරල අර්ථය පැහැදිලි කරන්න.

ii. දුටුගැමුණු මහ රජතුමා සම්බුදු සසුන උදෙසා කළ උතුම් මෙහෙවර උදාහරණ දෙකක් ඇතුළත් වනසේ විස්තර කරන්න.

**( ලකුණු 5 + 7 = 12 )**

5. i. ඉවසීමෙන් අපට ලද හැකි ප්‍රයෝජන **පහක්** ලියන්න.

ii. ඉවසීම නොමැතිකම සමාජ ගැටලු ඇති වීමට හේතු වේ. උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**( ලකුණු 5 + 7 = 12 )**

6. පහත සඳහන් ගාථා අතරින් දෙකක් සම්පූර්ණ කර අර්ථය ලියන්න.

I. යථාපි භමරො පුප්ඵං...

II. චන්දනං තගරං වාපි...

III. අප්පමත්තො අයං ගන්ධො...

**( ලකුණු 6 + 6 = 12 )**

7. i. සමුද්දවාණිජ ජාතකයේ අතීත කතාව කෙටියෙන් ලියන්න.

ii. මිනිසුන් නොමග යැවූ දේවතාවා වැනි අසත්‍ය ප්‍රකාශ කිරීමෙන් සමාජයට සිදු විය හැකි විපත් පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

**( ලකුණු 5 + 7 = 12 )**

8. i. අහේතුක සිත් දහඅට බෙදෙන ප්‍රධාන කොටස් **තුන** දක්වන්න.

ii. අකුසල විපාක සිත් **හත** ලියා දක්වන්න.

**( ලකුණු 5 + 7 = 12 )**

9. i. බ්‍රාහ්මණ ඉගැන්වීමේ එන බ්‍රාහ්මණ **ස්වධර්ම** නම් කරන්න.

ii. ක්‍ෂුද්‍ර වංශිකයන්ට හිමි වූ **ස්වධර්ම** පිළිබඳ හැඳින්වීමක් කරන්න.

**( ලකුණු 5 + 7 = 12 )**

* * *